සබරගමුව පළාත් සභාව

சபரகமுவ மாகாண சபை

**SABARAGAMUWA PROVINCIAL COUNCIL**

***2017 අප්‍රේල් මස 25 අඟහරුවාදා දින***

*2017 ஏப்ரல் மாதம் 25 ஆம் திகதி செவ்வாயக்கிழமை* ***Tuesday 25 th April 2017***

ගරු නියෝජ්‍ය සභාපති උදයකාන්ත ගුණතිලක මැතිතුමාගේ මූලාසනාරූඪත්වයෙන් පෙ.ව.10.00 ට සභාව රැස්විය.

கௌரவ பிரதித் தவிசாளர் – உதயகாந்த குணதிலக அவர்களின் தலைமை வகித்தார்கள் மு.ப. 10.00 மணிக்கு சபைக் கூடியது.

The Council met at 10.00 a.m Hon.D.Chairman_Udayakantha Gunathilaka preside the Chair

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***

***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***

*Hon.D.Chairman Udayakantha Gunathilaka*

------------------------------------------------------------

සියළුදෙනාටම සුභ උදෑසනක්, සුභ දවසක් ප්‍රාර්ථනා කරනවා. සබරගමුව පළාත් සභාවේ අපේ ප්‍රධාන අමාත්‍යතුමා, ඒ වගේම අමාත්‍යතුමන්ලා, ආණ්ඩු පක්ෂ සංවිධායකතුමා, සියළුම මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. ඒ වගේම විපක්ෂනායකතුමා අද පැමිණ නෑ. ඒ වගේම විපක්ෂ සංවිධායකතුමා ඇතුළු සියළුම මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. විශේෂයෙන්ම 2017 ක් වූ අප්‍රේල් මස 25 වෙනි දින සිංහල හා හින්දු අළුත් අවුරුද්දෙන් පස්සේ පළවෙනි සභාව. ඒ නිසා මේ අවස්ථාවේ සියළුදෙනාටම සිංහල හා හින්දු අළුත් අවුරුද්ද වෙනුවෙන් සුභ පතනවා. ඒ වගේම සාමය, සතුට පිරි අළුත් අවුරුද්දක් වේවා ! කියලා ප්‍රාර්ථනා කරනවා වගේම සභාපතිතුමා අද නොමැති වුනත්, සභාපතිතුමා වෙනුවෙනුත් මේ අවස්ථාවේ සියළුදෙනාටම සුභ පතමින්, න්‍යාය පත්‍රානුකූලව සභාව ගෙන යාම සඳහා සියළුදෙනාගේම සහයෝගය බලාපොරොත්තු වෙනවා. න්‍යාය පත්‍රානුකූලව පළමුව,

අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම් දීම් : නැත

ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ : නැත

නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳව යෝජනා :

ගරු අමාත්‍ය ශ්‍රීලාල් වික්‍රමසිංහ මැතිතුමා.
ගරු අමාත්‍ය ප්‍රභාත් භාණු මුණිප්‍රිය මැතිතුමා.
විපක්ෂනායක ඩබ්ලිව්.සෝමදාස මැතිතුමා.
ගරු මන්ත්‍රී ඉම්තියාස් කාදර් මැතිතුමා.
ගරු මන්ත්‍රී ආනන්ද මිල්ලන්ගොඩ මැතිතුමා.
ගරු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා.
ගරු මන්ත්‍රී සලිත කරුණාරත්න මැතිතුමා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***

***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***

*Hon.D.Chairman Udayakantha Gunathilaka*

------------------------------------------------------------

සියළුදෙනාටම නිවාඩු අනුමත වෙනවා.

ලිපි ලේඛණ පිළිගැන්වීම :

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------------

ගරු මන්ත්‍රී ආරියවංශ බාසූරිය මැතිතුමා 2017.02.08 වෙනි දින ලිපිය. ගරු මන්ත්‍රී ආරියවංශ බාසූරිය මැතිතුමා 2017.04.04 වෙනි දින ලිපිය. ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා 2017.04.04 දින ලිපිය සභාගත කරනවා.

කාරක සභා වාර්තා පිළිගැන්වීම : නැත

පෙත්සම් :

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------------

ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය මැතිතුමා විසින් සභාගත කරන ලද පෙත්සම සඳහා අවස්ථාව.

*ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය* *கௌரவ நமிந்த அனுரபிரிய* *Hon.Member Naminda Anurapriya*
------------------------------------------------------------

ගරු සභාපතිතුමනි, බුළුතොට, පිටකන්ද ලිපිනයේ පදිංචි ආර්.ඒ.පියදාස මහතා විසින් ඉදිරිපත් කර ඇති පෙත්සම සභාගත කරනවා.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------------

පෙත්සම් කාරක සභාව සඳහා එම පෙත්සම යොමු කරන්න අවශ්‍ය කටයුතු කරනවා.

ප්‍රශ්න : නැත

අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ : නැත

පෞද්ගලික ප්‍රකාශ කිරීම් :

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------------

නමින්ද අනුරප්‍රිය මැතිතුමා.

*ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය* *கௌரவ நமிந்த அனுரபிரிய* *Hon.Member Naminda Anurapriya*
------------------------------------------------------------

ගරු සභාපතිතුමනි, පෞද්ගලික ප්‍රකාශ කිරීම් යටතේ මම විශේෂයෙන්ම අවස්ථාව ඉල්ලා සිටියේ ගරු සභාපතිතුමනි, පසුගිය සිංහල හා හින්දු අළුත් අවුරුද්ද දිනයේ මුළු රටටම ඛේදවාචකයන් වුන, මහත්

ව්‍යසනයකට ලක් වුන මීතොටුමුල්ල, කුණු කන්ද නාය යෑම නිසා විපතට පත්වුන සියළු ජනතාවට පළමුව සබරගමුව පළාත් සභාවේ කණගාටුව මා පළමුව ප්‍රකාශ කර සිටිනවා. ඒ අවතැන් වුන ජනතාවට, ඒ වගේම මියගිය අයට, ඒ අයගේ පවුල්වල ඥාතීන්ට මේ අවස්ථාවේ අවස්ථාවක් කරගන්නවා ගරු සභාපතිතුමනි. මොකද මේ විෂයය අපට අයිති විෂයයක්. අපේ සබරගමුව පළාත් සභාවේ මම හිතන්නේ අපේ ප්‍රධාන අමාත්‍යතුමා පළාත් පාලන අමාත්‍යවරයා හැටියට ඉතාමත්ම ආදර්ශමත් විදිහට සබරගමුව පළාත තුළම කසළ කළමනාකරණය, අපද්‍රව්‍ය බැහැර කිරීම විශේෂයෙන්ම රටේම ආදර්ශමත් පළාත් පාලන ආයතන ගණනාවක්ම අපේ රත්නපුර දිස්ත්‍රික්කය, කෑගල්ල දිස්ත්‍රික්කය තුළින් බිහි කරන්න කටයුතු කරලා තියෙනවා.

හැබැයි ගරු සභාපතිතුමනි, මා මේක පෞද්ගලිකව කථා කරන්න යොදා ගත්තේ මීතොටමුල්ල කුණු කන්ද නාය යෑම, කඩා වැටීම මුළු ලෝකය පුරා ප්‍රචාරය වුනාට පස්සේ. මම හිතන්නේ අපේ රට පිළිබඳව තිබුණ කීර්ති නාමය, අපේ රට පිළිබඳව ලෝකය පුරා තිබුණ තත්ත්වය ආපස්සට පහතට වැටුන බව තමයි මේක සිදුවුන දා ඉඳන් ලෝකය පුරා අපට අහන්න, දකින්න ලැබුනේ. මොකද ඉතාමත්ම දුප්පත් ගණයේ රටවල්වල තත්ත්වයට අපේ රටෙත් කසළ කඳු කඩා වැටිලා මිනිස්සු මිය යන මට්ටමට එවැනි ඛේදවාචක අහන්නට ලැබීම පිළිබඳව ඉතාම කණගාටුදායක තත්ත්වයක්. ඒ නිසා අපේ රට හැටියට ඉතාමත්ම අපකීර්තියට පත් වුනා මුළු ලෝකය පුරාම. ඒ නිසා මේකට වගකිව යුතු අය වගකිව යුතුමයි. ඒ වගේම මේ කසළ පිළිබඳව ගරු සභාපතිතුමනි, මීට වඩා දැඩි නීති ගේන්නට කටයුතු කරන්න ඕන. ඒ නිසා අපේ ප්‍රධාන අමාත්‍යතුමාගෙන් විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා, අපි සබරගමුව පළාතෙන් මේක ආරම්භ කරමු. ආදර්ශමත් විදිහට අපට විදේශ සංචාරවල දී , අපට කියා දීලා තියන විදිහට අපි අධ්‍යයනය කරපු ඒවා අනුව උපදෙස් අරගෙන, අපේ ප්‍රදේශවල එහෙම විශාල කුණු කඳු නෑ. නමුත් අපේ දිස්ත්‍රික්කවලත් අනාගතයේ දී මෙවැනි කුණු කඳු ගොඩ ගැසීමේ අවධානමක් තිබෙන්නට පුළුවන්කම තිබෙනවා. රත්නපුරෙත් කුණු කන්දක් තියනවා කනාදොල කියන ප්‍රදේශය තුළ. ඒවා එන්න එන්න ටික ටික අඩුකර ගැනීම අපේ කාලයේ කළොත් මේවා අඩු කරගන්න පුළුවන්. නැත්නම් තව තවත් මෙවැනි කඳු ගොඩගැහීම වැඩි වෙන්න පුළුවන් කියන කාරණාව මතක් කර සිටිනවා.

ඒ අතරම ගරු සභාපතිතුමනි, මේ කුණු ප්‍රශ්නයට විසඳුම් හැටියට ලෝකය පුරාමත්, අපේ රටේ අයත් මේක කළමනාකරණය කිරීම පිළිබඳව නොයෙකුත් වැඩ පිළිවෙලවල් ගෙනල්ලා තිබෙනවා. මම මේ වෙලාවේ පෞද්ගලිකවම ගරු ප්‍රධාන ඇමතිතුමාගේ උපදේශක කාරක සභාවට ඉදිරිපත් කිරීම සඳහා මා ද, මාගේ මිත්‍ර ගොවියෙකුගේ මාර්ගයෙන් සහ හිටපු අතිරේක ලේකම්වරයෙක් හැටියට ඔහුගේ අවුරුදු 10 ක අත්දැකීම් යටතේ සාමාන්‍ය පර්චර්ස් 10 ක, 20 ක, 30 ක ඉඩමක කෙනෙක් ඉන්නවා නම් ඒ අයගේ කුණු ටික වෙනත් ප්‍රදේශවලට දාන්නේ නැතුව තමන්ගේ නිවසේම කළමනාකරණය කරගත හැකි ක්‍රමවේදයක් අපේ ගොවි මහත්වරු හොයාගෙන තිබෙනවා. ඒ නිසා ඒක සාර්ථක ක්‍රමයක්. ඒ නිසා මා මේක අද මේ අවස්ථාවේ දී අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ උපදේශක කාරක සභාවට මේ යෝජනාවලියේ ඇතුළත් වූ ඒ යෝජනාව මා සභාගත කර සිටිනවා අපේ ප්‍රධාන අමාත්‍යතුමාට ලබාදෙන්න කියන කාරණාව.

ඒ වගේම ගරු සභාපතිතුමනි, සිංහල හින්දු අළුත් අවුරුද්ද දවසේම තමයි මේ කටයුත්ත වුනේ. ඉතින් අපට අවුරුදු කන්න බැරි වුනා. මොකද නැකතේ වැරැද්ද ද දන්නෙත් නෑ. කොහොම හරි වෙලාවට රටේ අය එකට කැවෙත් නෑ. ඒ නිසා මෙවැනි ඛේදවාචක ඇසීමට නොලැබේවා ! කියලා මේ

අවුරුදු මාසයේ අවසානයත්, වෙසක් මාසයේ ආරම්භයත් එක්ක ප්‍රාර්ථනා කරනවා. සුභවාදී කාල පරිච්ඡේදයක් මේ රටට අත්වේවා ! කියන ප්‍රාර්ථනයත්, මෙවැනි ඛේදවාචක අහන්න, දකින්න නොලැබේවා ! කියන ප්‍රාර්ථනයත් මේ සබරගමුව පළාත් සභාවේ මා යෝජනා කර සිටිනවා.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
---------------------------------------------------------------

බොහොම ස්තුතියි ! නමින්ද අනුරප්‍රිය ගරු මන්ත්‍රීතුමනි.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல Hon.Opposition Whip Siripala Kiriella* --------------
---------------------------------------

ගරු සභාපතිතුමනි, අපේ නමින්ද අනුරප්‍රිය ගරු මන්ත්‍රීතුමා කියපු ආකාරයට මේ සම්බන්ධයෙන් අදහසක් දැක්වුවොත් වැදගත් වෙනවා. මේ කුණු කන්ද අද ඊයේ ආපු එකක් නෙමෙයි ගරු සභාපතිතුමනි. අවුරුදු 25 ක්, 30 ක් තිස්සේ ක්‍රම ක්‍රමයට ගොඩ ගැහිච්ච කුණු කන්දක්. ඉතින් මේක හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ එතුමා මේකට දීර්ඝ කාලීන වැඩ පිළිවෙලක් සකස් කරගෙන හිටියා. නමුත් ඒ ප්‍රදේශයේ ජීවත් වෙන ජනතාව ගත්තාම ගරු සභාපතිතුමනි, කුණු ටික ඒගොල්ලන්ගේ ආර්ථික ආදායම් මාර්ගයක් විදිහට තමයි හදාගෙන තිබුනේ ගරු සභාපතිතුමනි. ඉතින් ඒ නිසා එතුමාටත් ඒක කරගන්න බැරි වුනා. ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමත් මේ සම්බන්ධයෙන් ලිපියක් දාලා තිබුණා. ඒ ලිපි දෙකෙන්ම දැන ගන්න පුළුවන් තමුන්නාන්සේලාට මොකක්ද මේ කාරණාව කියන එක. මේක එතන ඉන්න උදවිය ජීවත් වෙන්නේ මේකෙන්. බහුතරයක් ගත්තාම ගරු සභාපතිතුමනි. ඒ නිසා රජය මේ ගැන විකල්පයක් යෙදුවා. ඒ විකල්පයටත් කැමති නෑ. නමුත් ඒ කුණු ඇදලා දාන්න තැනක් ගත්තා, එතනත් ඇහිරීමක් කරනවා. ඒක හොඳට හෝ නරකට. හොඳට වෙන්නේ නෑ. නරකට. මොකද ජනතාව ගැන හිතනවා නම්, ජනතාවගේ සුභ සිද්ධිය ගැන හිතනවා නම් කුණු කසළ කියන ඒවා ඉවත් කරලා, පිරිසිදු භාවය ඇති කරන්න ඕන. නමුත් මෙතන ඒ ජනතාවගේම බලපෑමෙන් තමයි ඒ සිද්ධිය සිද්ධ වෙලා තියෙන්නේ. කොහොම වුනත් අතිගරු ජනාධිපතිතුමා මේ ගැන විකල්පයක් අද හෙටම අරගන්නවා. අර කුණු ඉවත් කිරීම සඳහා වැඩ පිළිවෙලක් දැනට දියත් කරලා තියනවා. මේක වැඩි කාලයක් යන කුණු කන්දක් නෙමෙයි කියන එක ප්‍රකාශ කරනවා.

ඒ වගේම මෙතුමා කියාපු ආකාරයට ගෙයක් ගෙයක් ගානේ කුණු කසළ බැහැර කිරීම ඒ ජනතාව ගන්නා ක්‍රියා මාර්ගයක් නම්, ඒක හරි වැදගත් වෙනවා. ඒක අද ඊයේ කියන එකක් නෙමෙයි අවුරුදු විසි ගාණක් තිස්සේ අපි කියනවා. ඉතින් කොහොම හරි මේ කුණු කන්ද අපට සබරගමුවට එන්න කලින් අපි අපේ ප්‍රදේශවල තියන කුණු ටිකත් මොනවා හරි කරලා එක්කො කොම්පෝස්ට් පොහොර. නැත්නම් වෙනත් ක්‍රමයක් ජනතාවට අවහිරයක් නොවෙන ආකාරයට කටයුතු කරන්න වගබලා ගන්න කියලා මම අපේ ප්‍රධාන ඇමති මහීපාල හේරත් මැතිතුමාට යෝජනා කරනවා ගරු සභාපතිතුමනි.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------------

හොඳයි, විපක්ෂයේ සංවිධායකතුමනි.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර් கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார் Hon.Member M.Y.M.Iflar*
-----------------------------------------

ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම අද දිනයේ අපි රැස්වෙලා සිටින මේ මොහොතේ අපේ පළාත් සභාවේ ගරු මාර්ග අමාත්‍යතුමාගේ උපන් දිනය අද දිනයේ. එතුමාට සුභ උපන් දිනයක් ප්‍රාර්ථනා කරන අතර, එතුමාට දුකෙන් තොර, සැපෙන් බර නිරෝගීමත් ජීවිතයක් ගත කිරීමටත්, ඒ වගේම එතුමාගේ සියළු සිතුම් පැතුම් ඉටුවෙන වාසනාවන්ත වසරක් වේවා ! කියලා ප්‍රාර්ථනා කරනවා. අපට නොසැළකුවත් අපි ප්‍රාර්ථනා කරනවා එතුමාට සියළු සිතුම් පැතුම් ඉටුවෙන වාසනාවන්ත වසරක්ම වේවා ! කියලා ප්‍රාර්ථනා කරනවා.

ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවේ දී ගරු ප්‍රධාන ඇමතිතුමාට යෝජනා කරලා, ඉල්ලීමක් කරනවා ප්‍රශ්නයක් සම්බන්ධයෙන්.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------------

මේ සභාවේ න්‍යාය පත්‍රයක් හැටියට වැඩ කෙරෙනවා. එහෙම ඉල්ලීමක් කරලා තිබුණා නම් මම අවස්ථාව දෙනවා. ප්‍රශ්නය තියෙන්නේ එහෙම ඉල්ලීමක් නැතුව මන්ත්‍රීවරු අවශ්‍ය විදිහට එක එක මගේ ඉල්ලීමක් තියනවා කියලා ඉල්ලන්න ගියොත් කොහොම ද න්‍යාය පත්‍රයක් අනුව වැඩ කටයුතු කරන්නේ ? ඔබතුමා එහෙම නම් සභාව කල් තියන අවස්ථාවේ යෝජනා හැටියට ඉදිරිපත් කරන්න. ඒකට අවස්ථාව තියනවා.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර් கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார் Hon.Member M.Y.M.Iflar*
-----------------------------------------

මම බැලුවේ, දැන් මේ පොඩි එකක් තියෙන්නේ.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------------

පොඩි ඉඩක් වුනත් න්‍යාය පත්‍රයේ දැන් මේක කවුරුත් දන්නවා ඔබතුමා ඉල්ලලා නෑ කියලා. දැන් මේ කථාව කරන්න අවස්ථාව දීම මම කියන්නේ සභාවක් හැටියට ගැලපෙන්නේ නෑ. තවත් කෙනෙක් නැගිටින්න පුළුවන් ඔබතුමා ලියුම අතේ තියාගෙන මේක මූලාසනයට දෙන්නේ නැතුව ඔබතුමා ඉදිරිපත් කිරීම,

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්* ගෞරව
*உறுப்பினர் எம்.வை.எம்.இப்லார்* *Hon.Member*
*M.Y.M.Iflar* -----------
------------------------------

මම එහෙම නම් ඉල්ලීමක් කරනවා සභාව කල් තියන අවස්ථාවේ දී මට අවස්ථාව දෙන්න කියලා.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
---------------------------------------------------------------

ගැටළුවක් නෑ. ඔබතුමාට තියන අයිතියක්නේ. ඒ නිසා ප්‍රශ්නයක් නෑ. ඊළඟට ගරු මන්ත්‍රී කරුණාපාල මැතිතුමාට අවස්ථාව තියනවා.

*ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල* ගෞරව
*உறுப்பினர் ஜீ.எம்.கருணாபால* *Hon.Member*
*G.M.Karunapala* ---------------
--------------------------

ගරු සභාපතිතුමනි, නමින්ද අනුරප්‍රිය සහෝදර මන්ත්‍රීතුමා මේ මීතොටමුල්ලේ සිදුවුන සිද්ධිය පිළිබඳව විග්‍රහයක යෙදුනා. මුලින්ම ඒ පවුල්වල සියළුදෙනා සමඟ ශෝකය බෙදා හදාගන්න ගමන්ම කවුරු මොනවා කිව්වත් මේ මරණවලට වගකිව යුතුයි මේ වත්මන් ආණ්ඩුව. ඒක දැඩි ලෙස මම කියා සිටිනවා. වත්මන් ආණ්ඩුව වගකිව යුතුයි. එක එක මතවාද තියෙන්න පුළුවන්. හැබැයි මම මේකෙදී බලාපොරොත්තු වෙන්නේ වෙන කිසියම් දෙයක් නොවෙයි.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්* ගෞරව
*உறுப்பினர் எம்.வை.எம்.இப்லார்* *Hon.Member*
*M.Y.M.Iflar* -----------
------------------------------

පෞද්ගලික ප්‍රශ්නද ?

*ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල* ගෞරව
*உறுப்பினர் ஜீ.எம்.கருணாபால* *Hon.Member*
*G.M.Karunapala* ---------------
--------------------------

ඉල්ලීමක් කරලා තියෙන්නේ. මම කොළඹ ගිහිල්ලා එනකොට ආවේ පරණ පාරේ.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
---------------------------------------------------------------

අපි බලමු. සභාවට ප්‍රශ්නයක් වෙනවා නම් අපි එතුමාට කථා කරලා කියමු.

*ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල* ගෞරව
*உறுப்பினர் ஜீ.எம்.கருணாபால* *Hon.Member*
*G.M.Karunapala* ---------------
--------------------------

ඒකත් පෞද්ගලිකයි. ගරු සභාපතිතුමනි, මම නැවතත් කියනවා, මගේ කතාව අහගෙන ඉන්න.

(සභාවෙන් සෝෂා)

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
-------------------------------------------------------------

එතුමාට යම්කිසි අවස්ථාවක් අපි දියයුතුයි. අපි දන්නෙ නෑ, එතුමාගේ අදහස මොකක්ද කියලා.

*ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால Hon.Member G.M.Karunapala* ---------------------------------------

ගරු සභාපතිතුමනි, මෙන්න පහුගිය සභාවේ වාර්තාව හරියට කියවලා බැලුවොත් එහෙම ඉෆ්ලාර් මන්ත්‍රීතුමා මම කියන ඒවාට බාධා කරන්නේ නෑ. මම කිව්වා, මම කියන දේ හොඳට....

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல Hon.Opposition Whip Siripala Kiriella* ---------------------------------------------------

පෞද්ගලික ප්‍රශ්න ද මේ ?

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
-------------------------------------------------------------

අපි දන්නේ නැහැනේ. ඔහුට තියන අයිතියක් මට නැති කරන්න පුළුවන් කමක් නෑ.

*ගරු මන්ත්‍රී ප්‍රභාත් මහේෂ් ද අල්විස් கௌரவ உறுப்பினர் பிரபாத் மஹேஷ த அல்விஸ் Hon.Member Prabath Mahesha de Alwis* ---------------------------------------

ගරු සභාපතිතුමනි, පාසැල් දරුවොත් ඉන්නවා. ඒක හින්දා සභාපතිතුමා මේ සභාව හැසිරෙව්වොත් හොඳයි නේද ? පාසැල් දරුවොත් ඉන්නවා උඩ.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
-------------------------------------------------------------

මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද, කථා කරන්න තියන අයිතිය අහුරනවා නම්, ඒක අපි මේ කථා කරන්න ඉදිරිපත් වෙනකොටම අපි කොහොමද දන්නේ, ඒ මන්ත්‍රීවරයාට ප්‍රශ්නයක් වෙලා නෑ කියලා කියන්නේ කොහොමද ? ඒක ඔහුට තියන අයිතියක්. ඒක ඔහු ඉදිරිපත් කළාට පස්සේ ඒක දිගට යනවා නම් ඊට පස්සේ මූලාසනයට තීරණයක් ගන්න පුළුවන් ඒක නවත්වන්න.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල*** ***கௌரவ***
***உறுப்பினர் ஜீ.எம்.கருணாபால*** *Hon.Member*
*G.M.Karunapala* ---------------
-------------------------

මගේ පෞද්ගලික හේතුව මම කියනවා. ගරු සභාපතිතුමනි, අපි සාමාන්‍යයෙන් දැන උගත් අය හැටියට කවුරුවත් කථා කරනකොට බාධා කරන්නේ නෑ. හොඳට අහගෙන ඉන්නවා. අහගෙන අවස්ථාවක් ලදොත් උත්තර දෙන පිරිසක් අපි.

ඉතින් මම පහුගිය හැන්සාඩ් වාර්තාවේ සඳහන් පරිදි එක මන්ත්‍රීවරයෙකුට මම දවසක් කිව්වා පහුගිය සභාවේ, මේ මා කියන දේ හොඳට ඇහුම්කන් දීලා තේරුම් ගත්තොත් පූර්ණ මොළය ඇති අයෙකු වියහැකියි කියලා. ඒක තමයි අදත් මම සිහිපත් කරන්නේ. මේක තමයි මේ වසරේ සිදුවුන ලොකුම ඛේදවාචකය. මීතොටමුල්ල. පෞද්ගලික ප්‍රශ්නයක් වෙන්නේ කොහොමද ? මම කිරිදිවැල ප්‍රදේශයේ ගිහාම පැය 3 ක් මම රස්තියාදු වුනා. අන්න පෞද්ගලික ප්‍රශ්නය. ඕක අහගෙන හිටියා නම් ඉවරයිනේ. මම පෙරෙයිදා කොළඹ ගිහිල්ලා පරණ පාරේ අවේ නෑ, ලඟ වුනාට. ගඳ හින්දා. ඉතින් කවුද මේකට වගකියන්න ඕන ? මේකට පහුගිය රජය මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ සැළසුම් සහගත වැඩක් කළා. ඒක ආණ්ඩු පෙරළියත් සමඟ අහෝසි වුනා. මේක චෝදනා කරනවා නම් කරුණාපාලට නෙමෙයි චෝදනා කරන්න ඕන, දෙරණ මාධ්‍යයට. පුණ පුණා කිව්වා පහුගිය ටිකේ. තමුන්නාන්සේලයි, අපියි මේකට හැප්පෙන්න ඕන නෑ. අපි මේ කියන්නේ මේ සිද්ධිය ගැන අපි පුණ පුණා කියලා මේ අසාධාරණය සිදුවුන අයට සහන සැළසීම ඉක්මන් කිරීමත්,

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්*** ***கௌரவ***
***உறுப்பினர் எம்.வை.எம்.இப்லார்*** *Hon.Member*
*M.Y.M.Iflar* -----------
-----------------------------

පැහැදිලිව කියනවා රීති මාලාවේ පෞද්ගලික ප්‍රකාශ. මේ ප්‍රකාශය සම්බන්ධයෙන් මට පැහැදිලි කරන්න පුළුවන්. ඉතාම පැහැදිලිව ඔබතුමාගෙන් නිශ්චිත අනුමැතියක් ලබාගත යුතුයි. 9.30 ට ඉස්සෙල්ලා ඒ සඳහා භාරදිය යුතුයි. පෞද්ගලික ප්‍රකාශය විවාදයක් නොවිය යුතුයි. ඒ වගේම ගරු සභාපතිතුමනි, ඔහුට පෞද්ගලිකවම ඒ සම්බන්ධයෙන් සිදුවිය යතුයි. මේ කරුණ සම්බන්ධයෙන් එතුමාට පෞද්ගලිකව වෙලා නෑ. මේ කොහෙද යන ගමන්. පෞද්ගලිකව මේ සභාව තුළ එතුමාට ක්‍රියාත්මක කළහැකි කිසි දෙයක් සිදුවෙලා නෑ. ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට පෙන්වන්නේ රීති මාලාවේ 19 වෙනි පිටුවේ 36, පෞද්ගලික ප්‍රකාශ. මේක මට පැහැදිලි කරලා දෙන්න ඔබතුමා, එතුමාට අවස්ථාව දෙනවා නම් කොයි ආකාරයෙන් ද මේක ප්‍රකාශ කරන්නේ ? කොහොමද එතුමාට මේක පෞද්ගලික වෙන්නේ කියන එක මා දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලනවා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக***
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
-------------------------------------------------------------

එතුමා මූලාසනයට ඒ අවශ්‍ය වේලාවට කලින් ලිපිය ලබාදුන්නා. ඒක එක කාරණාවක්. ඊළඟට පෞද්ගලික ප්‍රකාශ යටතේ එතුමා කිව්වා එතුමා කොළඹ ගියා. එතුමා අවශ්‍ය කාලයට වඩා රස්තියාදු වුනා. එතුමාට

ගඳ දැනුනා. ඒක පෞද්ගලික ප්‍රශ්නයක් ඉතින්. මට නෑ කියලා කියන්න පුළුවන් කමක් නෑ.

***ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ*** ගෞරව
*உறுப்பினர் ரம்ய குமார வீரசிங்க* *Hon.Member*
*Ramya Kumara Weerasinghe* -----------
--------------------------------------------

ගරු සභාපතිතුමනි, මේ සබරගමුව පළාත් සභාවට පෞද්ගලික ප්‍රකාශ කියලා පාන් මිළ වැඩි වුනාම, අරක්කු මිළ වැඩි වුනාම, බියර් බෝතලය, රා බෝතලය, පාන් ගෙඩිය අරගෙන ඇවිල්ලා ඒක පෞද්ගලික ප්‍රශ්න කියලා කථා කරපු මන්ත්‍රීවරු අද කියනවා මේක පෞද්ගලික ප්‍රශ්නයක් නෙමෙයිලු. ලැජ්ජයි මන්ත්‍රීතුමා. ඊටත් තමුන්නාන්සේලාට ඒවා පෞද්ගලික ප්‍රශ්න වෙන්නත්, මෙතුමාට මේක පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙන්නත් හේතුවක් නෑ. ඒ හින්දා කරුණාකරලා අහගෙන ඉන්න. වේදනයි තමයි. දුකයි තමයි. හිතට අමාරුයි තමයි. මේ ආණ්ඩුව වගකියන්න ඕන තමයි. ඒ හින්දා ඔබට දුකයි. අහගෙන ඉන්න මොකක්ද කියන්නේ කියලා.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල*** ගෞරව
*உறுப்பினர் ஜீ.எம்.கருணாபால* *Hon.Member*
*G.M.Karunapala* ---------------
--------------------------

ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් අවසරය අරගෙන මම ප්‍රකාශය කළේ, මට පෞද්ගලික, ඒ හා සම්බන්ධ තවත් පෞද්ගලික ප්‍රශ්නයක්. ඒ මළවුන් අතර මගේ ඥාතියෙක් මැරුනා. මම ඒකටත් සම්බන්ධ වුනා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------------

නෑ, මන්ත්‍රීතුමා, මෙතන ප්‍රශ්නය තියෙන්නේ මට හොඳද ? නරකද ? කියන කාරණාව නෙමෙයි. මන්ත්‍රීවරයෙක් ඉල්ලීමක් කළාම වගකීමක් තියෙන්න ඕන.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල*** ගෞරව
*உறுப்பினர் ஜீ.எம்.கருணாபால* *Hon.Member*
*G.M.Karunapala* ---------------
--------------------------

පුණ පුණා කියන්නේ මීතොටමුල්ල වගේ නැවත කුණු ගොඩවල් ගසන්නට ඉඩ නොදෙන්න කරුණු කාරණා අපි ඉදිරිපත් කරන්නේ. ඒකට තමුන්නාන්සේලාත් සහයෝගය දෙන්න ඕන. මේ සියළුදෙනාටම ඒක බලපෑවා. ගරු මහ ඇමතිතුමා මට මතකයි කහවත්තේ සිද්ධියක් ආවා කසළ සිද්ධියේ දී. එතුමා තීන්දුවක් ගත්තා, අතුල ඇමතිතුමා එහෙම එකතු වෙලා බොහොම සාමකාමීව ඒක විසඳලා දැම්මා. රත්නායක මන්ත්‍රීතුමාට එහෙම ඡන්ද 4000 ක් විතර අඩු වුනා, මම පෞද්ගලිකව දන්නවා. කුණුගොඩ හින්දා ඇහැළියගොඩ. පාසැල් විරෝධයක් ආවා. එහෙම බලපෑවා. මේක අපි සියළුදෙනා මිනිස්සු වශයෙන්, මහපොළවේ පය ගහන අය වශයෙන් මේකට සහයෝගය දක්වලා මේවා නැති කරන ක්‍රමවේද හදන්න ඕන. ඒකයි අපි කියන්නේ. අපි අතීතයේ සිහිපත් කරනවා සාලාවේ ප්‍රශ්නයට තවම විසඳුම් නෑ. අරණායක ප්‍රශ්නයට තවම විසඳුම් නෑ. ගංවතුරෙන් විපතට පත් වෙච්ච

අයට තවම විසඳුම් නෑ. නාය ගිය අපට තවම විසඳුම් නෑ. මෙහෙම කියද්දී මේ පංපෝරි ගැහිල්ල ඉක්මන් කරන්න කියලා අපි

කියන්නේ. අපි කයන ඒවා බොරු නම් නඩු දාන්න.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්* கௌரவ
உறுப்பினர் எம்.வை.எம்.இப்லார் Hon.Member M.Y.M.Iflar
----------------------------------------

මේ පෞද්ගලික ප්‍රකාශද ?

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------------

රීති ප්‍රශ්නයක් වශයෙන් කෙටියෙන් ඉදිරිපත් කිරීම විතරයි මට කියන්න පුළුවන්.

*ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල* கௌரவ
உறுப்பினர் ஜீ.எம்.கருணாபால Hon.Member G.M.Karunapala
----------------------------------------

පෞද්ගලික ප්‍රශ්න. ඇයි නාය ගිහාම අපි ගියේ නැද්ද ?

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------------

මට පුළුවන්කම තියෙන්නෙ රීතියේ තුන්වෙනි ජේදය යටතේ කෙටියෙන් දක්වන්න කියන කාරණාව විතරයි. ඔබතුමා කථා කරලා ඉවර කරන්න.

(සභාවෙන් ඝෝෂා)

*ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල* கௌரவ
உறுப்பினர் ஜீ.எம்.கருணாபால Hon.Member G.M.Karunapala
----------------------------------------

මම කණගාටු වෙනවා මේ වගේ ඇත හිතන්නේ නැති අයගේ සභාවක වාඩිවීමට ලැබීම ගැන. මම කණගාටු වෙනවා. අර බලන්නකො රත්තරං මනුස්සයෝ ඉන්නවා. පපු කැවුතු උණු වෙන කට්ටිය. කෑ ගහනවාද ? නැගිටිනවාද ? අපි මේ කියන ඒවා තමුන්නාන්සේලාගේ පාළකයින්ට කියන්න. අන්න අර මිනිස්සු මෙහෙම සබරගමුව පළාත් සභාවේ කෑ ගහලා කිව්වා. ඇයි ඉක්මන් නොකරන්නේ ? අපට ඊළඟ දවසේ හොඳට අහගෙන ඉදලා විසඳුම් දෙන එක තමයි යුතුකම. නාය ගිය එක හේතුවක් නෙමෙයි ද ? ගංවතුර හේතුවක් නෙමෙයි ද ? මම ඊයේ එක පන්සලකට ගිහාම

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක* கௌரவ
உறுப்பினர் கே.எல்.ரத்நாயக Hon.Member
K.L.Ratnayake ----------------
---------------------------------

මම බාධා කරනවා නෙමෙයි සභාපතිතුමා. මේක මෙහෙම දිගින් දිගට ගිහාම, එතුමාගේ කාරණාවලට මේ දෝෂාරෝපණය කරනවා නෙමෙයි. මේ සභාව හරියට ගෙනියන්න. නැති වුනොත් එහෙම මේක මේ වාදයකට ගිහිල්ලා මේ උත්තරීතර සභාවෙන් වැඩක් නැති වෙනවා. අනාගතය බාරගන්න ඉන්න දරුවෝ බලාගෙන ඉන්නවා. මොකක්ද මේකේ තේරුම ? මේකේ න්‍යාය පත්‍රයක් තියනවා. න්‍යාය පත්‍රයට යන්න.

*ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය* கௌரவ நமிந்த
அனுரபிரிய Hon.Member Naminda Anurapriya
----------------------------------------------------------

අපට කථා කරන්න තියන පළාත් සභාව මේක. පෞද්ගලික අවස්ථාව න්‍යාය පත්‍රයේ දාලා තියනවා නම් ඒ වෙලාව අපට ඕන. අපි ගෙදර ගිහිල්ලා කතා කරන්න යෑ.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக
Hon.D.Chairman Udayakantha Gunathilaka
------------------------------------------------------------------

ඔබතුමා අවසන් කරන්න.

*ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල* கௌரவ
உறுப்பினர் ஜீ.எம்.கருணாபால Hon.Member
G.M.Karunapala ---------------
---------------------------

ඉෆ්ලාර් මන්ත්‍රීතුමා මම හිතුවේ හොඳ උගත්, නැණවත්, බුද්ධිමත් කියලා. මම අද ඉදලා පිළිගන්නවා තමුන්නාන්සේ රූ ඉස්කෝලෙටවත් ගිහිල්ලා නෑ. ව්‍යාපාර ක්ෂේත්‍රයෙන් ඉහළට ගියාට රූ ඉස්කෝලෙටවත් ගියා නම් අපි කියන ඒවා අහනවා. අපි මේ බේදවාචකය ගැන පුණ පුණා කියන්නේ සහන ඉක්මන් කරන වැඩ පිළිවෙලක් එන්න. ආයේ මීතොටමුල්ල ඇති නොවෙන්නට ඉතිහාසයේ හේතු කාරණා පිළි අරගෙන පංපෝරි ගහන්නේ නැතුව මේ ආණ්ඩුවට අපි බල කරනවා සබරගමුව පළාත් සභාවේ ඉක්මන් වැඩ පිළිවෙලක් යොදන්න. හැමදාම හොරු, හොරු. අර ඉන්දියාව වගේ විශාල රටක ප්‍රතිපත්තියක් තියනවා දිගු කාලීන. ඒක වෙනස් වෙන්නේ නෑ. එහෙම නම් හොඳ දේවල්වත් හොඳයි කියන්න බැරි නම් මොකක්ද මේ පංපෝරි ගැහිල්ල. උද්ඝෝෂණ ඉවරද ? ඒ එක්කම අවසාන වශයෙන් ගරු සභාපතිතුමනි, මම මෛත්‍රීපාල ගරු ජනාධිපතිතුමා පිළිබඳ කණගාටු වෙනවා. මොකටද එතුමා ආඥාදායකත්වයේ මිනුම්පෙත්තටම ගිහිල්ලා මීට දවස් හතරකට උඩ දී රාත්‍රී 12.00 ට ගැසට් නිවේදනයක් නිකුත් කළා.

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක* கௌரவ
உறுப்பினர் கே.எல்.ரத்நாயக Hon.Member
K.L.Ratnayake ----------------
---------------------------------

ගරු සභාපතිතුමනි, මේ සභාවේ මීට පෙරත් මේ වගේ සිද්ධීන් වුනා. ගරු

සභාපතිතුමා මෙතන නැති අය සම්බන්ධයෙන් නම කියන්න එපා කිව්වා. නම කියලා ප්‍රකාශ කරන්න එපා කියලා කිව්වා. මේ තරහාට එහෙම කියනවා නෙමෙයි. මේ උත්තරීතර සභාව රකින්න. අපි මැරුනත් මේකේ අනාගතය භාරගන්න ඉන්න දරුවන්ට මේක රකලා දෙන්න ඕන. උත්තරීතර සභාව රකින්න ඕන.

*ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල* *ගෞරව*
*உறுப்பினர் ஜீ.எம்.கருணாபால* *Hon.Member*
*G.M.Karunapala* ---------------
--------------------------

නම මම ඉවත් කරගන්නවා. වත්මන් ජනාධිපති. දෙන්නෙක් නැහැනේ. මේ මෑතක දී එක තැනක අඩියක් ගහලා බෝතලේ අරගෙන යනකොට පොලිස් මහත්වරු දෙන්නෙත් මේ මනුස්සයාට කථා කරලා කණ පලනවා තොගේ. මොකද මේ මනුස්සයා ආණ්ඩුවට බැණ බැණ යනවා. මම ආණ්ඩුවට බැන්නද ? කියලා ඇහුවාම, ඕයි ආණ්ඩු දෙකක් නෑ ලංකාවේ කියලා කිව්වාලු. ඒ වගේම මම ඔබතුමාගේ අදහස අනුව මෛත්‍රීපාල සිරිසේන කියන නම ඉවත් කරලා වත්මන් ජනාධිපතිතුමාගේ ආඥාදායකත්වය එදා හෙළි කළා විශේෂ ගැසට් නිවේදනයකින්. නමුත් ඒ ගැසට් නිවේදනයට පහුවදා කිරිදිවැල හා ආසන්න ප්‍රදේශවල උද්ඝෝෂණ තිබුණා. මොකක්ද මේ ආඥාදායකත්වය ? ජේ.ආර්.ජයවර්ධන මැතිතුමා හැදුවා අඥාදායකත්වයක්, කිව්වොත් කිව්වා. කැත්තට පොල්ල වගේ හිටියා.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්* *ගෞරව*
*உறுப்பினர் எம்.வை.எம்.இப்லார்* *Hon.Member*
*M.Y.M.Iflar* -----------
------------------------------

මොකක්ද සභාපතිතුමා, මේ පෞද්ගලික ප්‍රකාශයක්ද ?

*ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල* *ගෞරව*
*உறுப்பினர் ஜீ.எம்.கருணாபால* *Hon.Member*
*G.M.Karunapala* ---------------
--------------------------

ඔන්න ඔන්න ආයෙත් රෑ ඉස්කෝලේ ගියේ නැති මහත්මයා. මේ 13 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මත ඔය රීතිද ඔය කෙහෙල්මල්වලට මගේ ප්‍රකාශනය වැරදි නම් අභියෝග කරනවා අධිකරණයට යන්න කියලා.

ඊළඟට මම කියන්නේ පහුවදාට පහුවදා පොලිස්පතිතුමා පොලීසිවලට නිවේදනයක් දෙනවා වහාම මේකට විරුද්ධ අයව අත් අඩංගුවට ගන්න කියලා. මොකක්ද මේ කොන්ද නැතිකම. එකම නායකයයි. එහෙම නම් නායකයෝ කීප දෙනෙක් ඉන්න බෑ. එහෙම නම් අවසාන වශයෙන් සභාපතිතුමනි, මගේ ඉල්ලීමට දැන් තමුන්නාන්සේ ඉඩකඩ දුන්නා.

*ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්*
*கௌரவ பிரதான அமைச்சர்*
*Hon.Chief Minister Mahipala Herath*
*------------------------------------------*

සභාපතිතුමනි, මට අවසර දෙන්න. අපි දැන් මේ සම්බන්ධයෙන් ගොඩාක් කථා කළා. ඇත්තටම මම මේ අවස්ථාවේ සබරගමුව පළාත් සභාව ලෙස මේ අවස්ථාවේ ජීවිත ගණනාවක් අපේ රටේ විනාශ වෙලා තියනවා. ඒක හින්දා සබරගමුව පළාත් සභාවේ අපි ඔක්කෝම, හැම කෙනෙකුම කථා කරන්නේ මෙහි යම්කිසි විදිහක ජනතාවට කණගාටුදායක සිද්ධියක් උඩ බොහොම ව්‍යසනයකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තියනවා. ඒ නිසා අපි අපේ පළාත ලෙස විශේෂයෙන්ම මේ මියගිය සියළුදෙනා වෙනුවෙන් සබරගමුව පළාත් සභාවේ ශෝකය අපි මේ අවස්ථාවේ දී ප්‍රකාශ කරමින්, අපේ ඉදිරි කටයුතු කරගෙන යෑම සුදුසුයි කියලා මම හිතනවා ගරු සභාපතිතුමනි.

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ* *கௌரவ*
*உறுப்பினர் ரம்ய குமார வீரசிங்க* *Hon.Member*
*Ramya Kumara Weerasinghe* *-----------*
*------------------------------------------*

ගරු සභාපතිතුමනි, මම මේ රීතිය පෙන්නලා දෙන්න හැදුවේ මේ සභාවේ තියනවා අපේ රීති පද්ධතියේ 36 (1) තියෙන්නේ සභාවේ එවැනි ප්‍රකාශක් ගැන වෙනත් මන්ත්‍රීවරයෙකුට කථා කිරීමට හෝ එම ප්‍රකාශය සම්බන්ධයෙන් විවාද කිරීමට හෝ ඉඩකඩ නොතිබිය යුත්තේය. එමෙන්ම මන්ත්‍රීවරයෙකුට වෙනත් මන්ත්‍රීවරයෙකු සම්බන්ධයෙන්. දැන් ගරු සභාපතිතුමනි, පළවෙනි රීතිය මෙහෙම තියෙද්දී අග තියන ඒවා අරගෙන මේගොල්ලෝ කෑ ගහන්න පටන් අරගෙන තියනවා. එතකොට පළවෙනි එක දිහා බලන්නේ නැතුව අන්තිම එක දිහා බලාගෙන කථා කරනවා. ඒ නිසා

කරුණාකරලා මන්ත්‍රීතුමා පළවෙනි එක දිහා බලලා ඊට පස්සේ අන්තිම එක දිහා බලන්න. ඒ නිසා තමුන්නාන්සේලාට මෙතුමාගේ පෞද්ගලික ප්‍රකාශය සම්බන්ධයෙන් වචනයක්වත් කථා කරන්න මේ සභාවේ රීති අනුව ඉඩක් ඇත්තේම නෑ. ඒ සම්බන්ධයෙන් ඉඩ දීම හෝ නොදීම පිළිබඳව පූර්ණ අයිතිය ගරු සභාපතිතුමාට තියනවා. ඒ නිසා ඒක පෙන්වා දෙමින් මම නිහඬ වෙනවා ගරු සභාපතිතුමනි.

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්* *கௌரவ*
*உறுப்பினர் எம்.வை.எம்.இப்லார்* *Hon.Member*
*M.Y.M.Iflar* *-----------*
*-----------------------------*

ගරු සභාපතිතුමනි, ප්‍රධාන ඇමතිතුමා ඒ පිළිබඳව කියලා ඉවර කළා. ආයේ මොකක්ද ? මේක ඔබතුමා විවාදයකට යනවා නම් අපටත් දෙන්න අවස්ථාව. අද සියළු යෝජනා අත්හිටුවලා ඔබතුමාට හැකියාව තියනවා මේ සම්බන්ධයෙන් විවාද කරලා, ඉතාම පැහැදිලිව කටයුතු කරන්න. මොකද මීටත් වඩා ඔබතුමා අවස්ථාව දෙනවා නම් අපට ප්‍රශ්නයක් තියනවා අද. ඔබතුමා පිළිබඳවත් ගැටළුවක් අද අපට මතුවෙනවා. ඒ වගේම මේ සභාව ගෙනයෑම සම්බන්ධයෙන් ගැටළුවකුත් අපට මතු වෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ගරු ප්‍රධාන ඇමතිතුමා අවසන් කළා. ඒකත් එක්කම දැන් අවසන් වියයුතුයි.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
*---------------------------------------------------------*

ප්‍රධාන ඇමතිතුමා එතුමා නායකයා හැටියට මේ සභාවේ අදහස් ඉදිරිපත් කළා. ඒ කාරණාව ඇත්ත. නමුත් කරුණාපාල මන්ත්‍රීතුමා ලිඛිතව ඉල්ලීමක් කරලා තියනවා නියම වෙලාවට.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්*** ***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்*** *Hon.Member M.Y.M.Iflar* -----------------------------------------

ඉතාම කෙටියන් කියලා තියනවා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*** ***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*** *Hon.D.Chairman Udayakantha Gunathilaka* ------------------------------------------------------------

ඉතාම කෙටියෙන් කියන කාරණාව තියනවා තමයි.

***ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ*** ***கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க*** *Hon.Member Ramya Kumara Weerasinghe* -----------------------------------------------------

ගරු සභාපතිතුමනි, රීතිය අනුව මෙතුමාට අයිතියක් නෑ මේක කථා කරන්න. ඔබතුමාගේ අයිතිය කොහොමද ඉෆ්ලාර් මන්ත්‍රීතුමා ගන්නේ ? සභාපතිතුමාගේ අයිතිය එතුමාට ගන්න බෑ.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*** ***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*** *Hon.D.Chairman Udayakantha Gunathilaka* ------------------------------------------------------------

මන්ත්‍රීතුමා ඉල්ලලා තියනවා මගෙන් ලිඛිතව ඉල්ලීම. එතකොට ප්‍රධාන ඇමතිතුමා හැටියට එතුමා ප්‍රකාශක් කළා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්*** ***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்*** *Hon.Member M.Y.M.Iflar* -----------------------------------------

එතුමා නිශ්චිත උත්තරයක් දීලා මෙතනින් පිට වෙලා ගියේ.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය*** ***கௌரவ நமிந்த அனுரபிரிய*** *Hon.Member Naminda Anurapriya* **-----------------------------------------------------------**

කාටවත් අයිතියක් නෑ, මෙතන බාධා කරන්න. න්‍යාය පත්‍රයට අනුව යන්න දෙන්න. ඔබතුමා දිගින් දිගටම කථාවට බාධා කරනවා. ඔහුගේ පෞද්ගලික අවශ්‍යතාවය අනුව කථා කරන්න අයිතිය දෙන්න ඕන. එහෙම නැත්නම් වැඩක් නැහැනේ. අපි මාසයකට වාර දෙකයි පළාත් සභාවට එන්නේ. ඒ එන වාර දෙකේ දී පළාත් සභාවේ කථා කරන්නේ නැත්නම් ගෙදර ගිහිල්ලා කථා කරන්නයැ. ඒ නිසා ඒ අවස්ථාව දෙන්න ඕන. ඔබතුමා පරක්කු වෙලා ඇවිල්ලා

න්‍යාය පත්‍රයට ඔබතුමාගේ පෞද්ගලික ප්‍රකාශයක් කරන්න ඉල්ලුවා. දැන් කෑ ගහනවා මෙතන. අපි වෙලාවට ඇවිල්ලා ඉල්ලුවා.

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.* *கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார* *Hon. Minister Ranjith Bandara* -----------------------------------------------------

ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා න්‍යාය පත්‍රයට අනුව වැඩ කටයුතු කරන ලෙස.

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ* *கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க* *Hon.Member Ramya Kumara Weerasinghe* -----------------------------------------------------

ගරු සභාපතිතුමනි, මම රීති ප්‍රශ්නයක් තමයි මතු කරන්න ආවේ. 36 (1) රීතිය අනුව මේ ගරු සභාවේ මේ සම්බන්ධයෙන් මීට වඩා වචනයක්වත් විපක්ෂයට කථා කරන්න කිසිම අයිතියක් නෑ. මේ සම්බන්ධයෙන් මැදිහත් වීටම කිසිම අයිතියක් නෑ. ඒ හින්දා 36 (1) රීතිය අනුව ගරු සභාපතිතුමනි, කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල* *கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல* *Hon.Opposition Whip Siripala Kiriella* -----------------------------------------------------

සභාපතිතුමාට ඕන ඕන විදිහට බෑ.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක* *கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka* -----------------------------------------------------

විපක්ෂ සංවිධායකතුමා එහෙම කථා කරන්න එපා. මට එතුමා නීත්‍යානුකූල ඉල්ලීම කරලා තියනවා. මහ ඇමතිතුමා ප්‍රකාශයක් කළ බව හැබෑව. මහ ඇමතිතුමා ප්‍රකාශ කළේ එතුමාගේ පෞද්ගලික කාරණාව. නමුත් ඉල්ලීම කරලා තියෙන්නේ ලිඛිතව මන්ත්‍රීතුමා. එතුමාට අවස්ථාව ලබාදීම මගේ වගකීම. එහෙම පුළුවන් කමක් නෑ කාගෙවත් කට වහන්න ප්‍රජාතන්ත්‍රවාදය අනුව. කාටවත් රිදෙනවා කියලා එහෙම නවත්වන්න පුළුවන් කමක් නෑ. ඔබතුමා අවසන් කරන්න කථා කරලා.

*ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල* *கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால* *Hon.Member G.M.Karunapala* -----------------------------------------------------

ගරු සභාපතිතුමනි, මම මීට වැඩිය කාලය ගන්නේ නෑ. සභාපතිතුමනි, කියලා තියනවා දේවෝ වස්සතු කාලේන කියලා. වැසි වසින්නෙත්, නාය යන්නෙත්, කුණු කන්දල් වැටෙන්නෙත් ඔක්කෝම පාලනයේ වැරැද්ද නිසා. කේන්ති යන අයට කේන්ති ගියාවේ. මේ මහා ලොකු ව්‍යවස්ථා සම්පාදන නීතිය දන්නේ නැති කමින් අපි බල කරනවා මේ ආණ්ඩුවට ඉක්මන් විසඳුම් දෙන්න කියලා.

න්‍යාය පත්‍රය එහෙම යන්න බැත

*ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්* *கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்* *Hon.Member M.Y.M.Iflar* -----------------------------------------

මෙතුමන්ලාගේ පව් අපි කර ගහන්නේ. ඔබතුමන්ලාගේ වැරදි තීරණ නිසා, එවකට තිබුණ රජය කරපු ගොන් වැඩ නිසා. වෙන මොකක්ද ?

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ* *கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க* *Hon.Member Ramya Kumara Weerasinghe* -----------------------------------------------------

රීති ප්‍රශ්නයක්. මේ සම්බන්ධයෙන් විවාද කිරීමේ අයිතියක් නෑ.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක* *கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka* ---------------------------------------------------------------

මට ආණ්ඩු පක්ෂයෙන් දුන්නත් ලිඛිතව, විපක්ෂයෙන් දුන්නත් මම අවස්ථාව දෙනවා.

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක* *கௌரவ உறுப்பினர் கே.எல்.ரத்நாயக* *Hon.Member K.L.Ratnayake* ------------------------------------------------

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක* *கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka* ---------------------------------------------------------------

ඒක බැරිද ? පුළුවන්ද ? කියලා මම තීරණය කරන්නම්.

(සභාවෙන් ඝෝෂා)

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක* *கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka* ---------------------------------------------------------------

ප්‍රශ්නය තියෙන්නේ මේක කාටවත් රිදෙනවා කියලා එහෙම කට වහන්න බැහැනේ කාගෙවත්.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල* *கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல Hon.Opposition Whip Siripala Kiriella* -------------------------------------------------------

මේක සබරගමුව පළාත් සභාව හෑල්ලුවට ලක් කිරීමේ ඉතිහාසයේ පළවෙනි දවස වුනා. රීති ප්‍රශ්නයක් අහනකොට ඒ රීති ප්‍රශ්නයට අනුව අවබෝධ කරගන්න බැරි නම්

මේ සභාවේ ඒ වැඩේ කරන්න අයිතියක් නෑ. ඔහුට කථා කරන්න අයිතියක් තියනවා. කථා කරන්න තියන අයිතිය අපි නෑ කියන්නේ නෑ. හරි අශෝභන වැඩක් මේක.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
-------------------------------------------------------------

කාටවත් රිදෙනවා කියලා මට කට වහන්න පුළුවන් කමක් නෑ. විපක්ෂයේ සංවිධායකතුමාට අවස්ථාව.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல Hon.Opposition Whip Siripala Kiriella* -------------
---------------------------------------

ගරු සභාපතිතුමනි, මගේ ප්‍රශ්නය, මම ආරක්ෂාව ඉල්ලුවේ ගරු සභාපතිතුමනි, 2017.04.03 වෙනිදා. මේ ගරු සභාවේ සභාගත කළා. ඊට පසුව ප්‍රධාන අමාත්‍යාංශයෙන් 04 වෙනි මාසේ 18 තමයි මේකේ පිළිතුරක් ඉල්ලලා තියෙන්නේ ගරු සභාපතිතුමනි. ගරු සභාපතිතුමනි, 04.18 තමයි ආරක්ෂාව සැපයීමට කටයුතු කරන්න අවස්ථාව ලබාදෙන්න කියලා තියෙන්නේ. එතකොට ඔය කාලය තුළ දවස් 15 ක කාලයක් ගිහිල්ලා තියනවා ගරු සභාපතිතුමනි. අද වෙනකොට දවස් විසි ගාණක් වෙලා තියනවා. මේක මේ පුද්ගලයෙකුට ආරක්ෂාව ඉල්ලන්නේ මම මේ ශෝභනයට පොලීසියෙන් අරගෙන යන්න එහෙම නෙමෙයි ගරු සභාපතිතුමනි. මට මේ රජය බලයට පත් වුනාට පස්සෙත් ආරක්ෂාව ඉල්ලන්න තුන් හතර පාරක් කිව්වා. අපි ආරක්ෂාව ඉල්ලුවේ නෑ. මේ ආරක්ෂාව ඉල්ලන්න හේතු ගණනාවක් ආවා ගරු සභාපතිතුමනි. මේ අසරණ ජනතාවට හරියාකාරව වැඩ කරනකොට, පරිසරය ආරක්ෂා කරගන්නකොට, පරිසරය වනසන අයගෙන් මේක බේරා ගන්න යනකොට මේවාට විරුද්ධව තමයි මගේ මරණ තර්ජන ඇවිල්ලා තියෙන්නේ. ඉතින් මම 04 වෙනි මාසයේ 03

වෙනිදා ඉල්ලපු ආරක්ෂාවට අද වෙනකොටත් පිළිතුරක් නැත්නම් ගරු සභාපතිතුමනි, අපි මැරුනාට පස්සෙ ද මේ ආරක්ෂාව දෙන්නේ ? අන්න ඒ ගැන මම මගේ කණගාටුව ප්‍රකාශ කරනවා. නැවත වාරයක් මගේ ලිපිය මම සභාගත කරනවා ගරු සභාපතිතුමනි. මේක ප්‍රධාන අමාත්‍යාංශයට ඇරලා තියෙන්නේ 2017.04.18 වෙනිදා තමයි මේ ආරක්ෂාව සැපයීම සුදුසු නම් මේක කරන්න කියලා. එතකොට එතන දින 15 ක කාලයක් ගිහිල්ලා තියනවා. දැන් අද වෙනකනුත් ආරක්ෂාව නෑ. මොකද පුද්ගලයෙක් මැරුනාට පස්සේ ආරක්ෂාවෙන් වැඩක් නෑ. අපට තියන තර්ජන, ගර්ජන ගත්තාම අතුල කුමාර රාහුබද්ධ මැතිතුමා දන්නවා. අපි කරන්න දෙන්නේ නෑ. දැන් හයකෝටි අනූ ලක්ෂයේ ඒවා දෙකක් කැඩුවා. ඇහැළියගොඩ දා හතර කෝටියක්. හාර කෝටි හතලිස් පන් ලක්ෂයක වැඩ කෙරුවා. මේවා කරනකොට පාරක් පාරක් ගානේ ගිහිල්ලා බලනවා. මේවා හරියට කරනවාද කියලා. ඒ.බී.සී. දාලා තියනවා ද අගල් 4 ක්. කොන්ක්‍රීට් එක හරියට අගල් 6 ක් තියනවාද ? මේක ප්‍රමිතියට කෙරෙනවාද ? මේවා බලන්න ගිහාම තමයි ජීවිතය අනතුරට ලක්වෙලා තියෙන්නේ. ඉතින් එවැනි අවස්ථාවක 04 වෙනි මාසයේ 03 වෙනිදා ඉල්ලපු ආරක්ෂාව අද තව වෙනකලුත් කෙරිලා නැත්නම් අපට තියෙන්නේ මේ ගරු සභාවට අපේ කණගාටුව ප්‍රකාශ කරන්නයි, ආරක්ෂාවක් දෙන්නේ නෑ කියන එක. මා ගාව තියනවා ෆයිල් එකක් මට තර්ජන ගර්ජන එනකොට කියාපු ඒවා. තමුන්නාන්සේලා දන්නවා මුරුත්තෙට්ටු කන්දේ දෙමහල් ගොඩනැගිල්ල 1,365,000 ක් ගෙව්වේ නෑ. අපේ වංචා විමර්ශණ කමිටුවේ ගරු සභාපති හැටියට හිටියේ අතුල කුමාර රාහුබද්ධ ඇමතිතුමා. ඒ ගිහිල්ලා ඒකේ ප්‍රමිතියට නෑ කියපු

ගොඩනැගිල්ලේ පොහොර උර 5 ක ගෙනාවා මැටි වලින් තනාපු ඒවා. ඒ ගෙනල්ලා ඒ 1,365,000 මා ගෙව්වේ නෑ. මේ වගේ කොන්ත්‍රාත්කාරයෝ විශාල තර්ජනයක් වෙලා තියනවා මට. එහෙම තියන තර්ජනයේ දී ආරක්ෂාව ඉල්ලලා අදත් පිළිතුරක් නැත්නම් මේ ගරු සභාවට මගේ කණගාටුව තමයි ගරු

සභාපතිතුමනි, ප්‍රකාශ කරන්න තියෙන්නේ. මම නැවත වාරයක් මේ ලියුමේ පිටපතක් තමුන්නාන්සේට එවනවා, ආරක්ෂාව දෙනවා නම් දෙන්න. නැත්නම් නිකම් ඉන්න කියලා.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
---------------------------------------------------------------

ලිපිය සභාගත කරන්න. ඒ වගේම සභාවට කණගාටුව ප්‍රකාශ කරලා වැඩක් නෑ. සභාවේ වගකීමක් නෙමෙයි. ඒක අදාළ අමාත්‍යාංශයේ වගකීමක්.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல Hon.Opposition Whip Siripala Kiriella* --------------
---------------------------------------

මම කියන්නේ ඒක නෙමෙයි. තමුන්නාන්සේ තේරුම් ගන්න මේක. මම කියන්නේ 04 වෙනි මාසේ 03 වෙනිදා බාරදුන්න එක 18 වෙනිදා ලියුමක් ගහනකොට, එතකොට දැන් අද 25 යි. 18 වෙනිදයි ලියුම ගහලා තියෙන්නේ. ඉතින් මේ දින 15 ක් එතනම ගිහිල්ලා තියනවා. ඉතින් මනුස්සයෙකුට මොකක්ද මේ ආරක්ෂාවක් නැතුව කරන්නේ. මම මගේ බුදලය ආරක්ෂා කරගන්න ඉල්ලනවා නෙමෙයි. අපි දැන් කෝටි හැට හැත්තෑවක වැඩ කරලා තියනවා. මේවායේ විනිවිධභාවයෙන් කටයුතු කරලා තියෙන්නේ. මේවා විනිවිධභාවයෙන් කටයුතු කරලා තියනවා හැම පාරක්ම බලලා. මේ වැරදි තියන ඒවායේ මුදල් එතනින් ගෙවන්න එපා කියනකොට අපේ ජීවිතයට තර්ජනයක්. ඒක තමයි මේ සභාවට කියලා තියෙන්නේ. එහෙම නම් ඒ ගැන අදත් තමුන්නාන්සේට මම බාර

දෙනවා. තමුන්නාන්සේ ගන්න ක්‍රියා මාර්ගයක් ගන්න කියනවා.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
---------------------------------------------------------------

නැවත වතාවක් මේක කඩිනමින් ආරක්ෂක අමාත්‍යාංශයට යවන්න අවශ්‍ය නියෝගය කරනවා.

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க Hon.Member Ramya Kumara Weerasinghe* -----------
--------------------------------------------

ගරු සභාපතිතුමනි, සමාවෙන්න. එතුමාගේ ඉල්ලීම හරි සාධාරණයි. හැබැයි මේක හරියට පාරේදී මිනිහෙක් ගහන්න ආපුවාම ගෙදර ඇවිල්ලා ගෑණිට ගැහුවා වගේ වැඩක්. මොකද තමුන්ගේ ආණ්ඩුවෙන් වෙච්ච වැරැද්ද, ආණ්ඩුවෙන් කරගන්න තිබුණ වැඩේ මධ්‍යම රජය තියාගෙන පළාත් සභාවේ සභාපතිතුමාට දොස් කියනවා මේක හම්බ වුනේ නෑ කියලා.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல* *Hon.Opposition Whip Siripala Kiriella* -------------- ----------------------------------------

සභාපතිතුමනි, පෞද්ගලික හේතු දක්වන වෙලාවේ අපේ කථාවලට තවත් මන්ත්‍රීවරුන්ට උත්තර දෙන්න අවස්ථාවක් නෑ.

මේක හැල්ලු කරන්න එපා. සභාව සභාව විදිහට ගෙනියන්න.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
-------------------------------------------------------------

අජිත් කුමාර මැද්දේගම මන්ත්‍රීතුමාට අවස්ථාව.

*ගරු මන්ත්‍රී අජිත් කුමාර* *கௌரவ உறுப்பினர் அஜித் குமார* *Hon.Member Ajith Kumara* ------------------------ ------------------------------------

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මට ලිපියක් ලැබිලා තියනවා අපේ ප්‍රධාන ඇමතිතුමාට ඇඩ්‍රස් කරපු, මට පිටපතක්. ඒ.බී. ප්‍රියනත කුමාර, ඇඹිලිපිටිය. ඇඩ්‍රස් එක. මම ඒ ලිපිය සභාගත කරනවා. ප්‍රධාන ඇමතිතුමාගෙන් මේ පිළිබඳ පරීක්ෂණයක් කරන ලෙස ඉල්ලා සිටිනවා.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
-------------------------------------------------------------

බොහොම ස්තුතියි ! ගරු මන්ත්‍රීතුමනි.

ශෝක ප්‍රකාශ යෝජනා : නැත

පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය නොවන යෝජනා : නැත.

පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය යෝජනා : නැත.

පළාත් සභාවේ පොදු කටයුතු :

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
-------------------------------------------------------------

සබරගමුව පළාත් සභාවේ කර්මාන්ත සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය සභාගත කිරීම. මෙම ප්‍රඥප්තිය රීති කාරක සභාවට යොමු කරලා තියනවා මේ වෙනකොට.

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.* *கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார* *Hon. Minister Ranjith Bandara* ----------------- -------------------------------------

ගරු සභාපතිතුමනි, එම ප්‍රඥප්තිය කාරක සභාවට යොමු කරන ලෙස මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

-------------------------------------------------------------

කාරක සභාවට මේ වෙනකොට යොමු කරලා තියනවා. ප්‍රඥප්ති පිටපතක් ඔබතුමන්ලා වෙත යොමු කරලා තියනවා.

ඊළඟට ප්‍රාදේශීය සභා අතුරු ව්‍යවස්ථා සභාගත කිරීම හා අනුමැතිය ලබා ගැනීම. ඒ පළාත් පාලන ආයතනවල ප්‍රඥප්ති මේ වෙනකොට මන්ත්‍රීවරුන්ට එවලා තියනවා. සභාවේ අනුමැතිය ලබා ගැනීමේ අවස්ථාව.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර*** *கௌரவ*
*உறுப்பினர் அஜித் குமார* *Hon.Member Ajith Kumara*

------------------------------------

ප්‍රඥප්ති කාරක සභාවේ වාර්තාව අපට ඇවිල්ලා නෑ.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

-------------------------------------------------------------

වාර්තාවත් එක්ක මන්ත්‍රීතුමන්ලාට යවලා තිබ්බා.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර*** *கௌரவ*
*உறுப்பினர் அஜித் குமார* *Hon.Member Ajith Kumara*

------------------------------------

නෑ, ප්‍රඥප්ති කාරක සභාවේ වාර්තාව අපට ඇවිල්ලා නෑ. ඒක ඉදිරිපත් කළා කියන්නවත් අපි දන්නෙ නෑ. මොකද ඒකේ සංශෝධනයක් ආවා නම් ඒ පිළිබඳව අපි දැනුවත් වෙන්න අවශ්‍යයි.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*

-------------------------------------------------------------

මම දන්න හැටියට නම් ප්‍රඥප්ති කාරක සභාවෙන් පස්සේ තමයි එවලා තිබ්බේ.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර*** *கௌரவ*
*உறுப்பினர் அஜித் குமார* *Hon.Member Ajith Kumara*

------------------------------------

ගරු සභාපතිතුමනි, ප්‍රඥප්ති කාරක සභාවට මේක යොමු කළා. යොමු කරලා අවසානයේ දී මේක මේ වාර්තාවන් මන්ත්‍රීවරුන්ට මේ වෙනකොට ලැබිලා නෑ. ඒ ලැබිලා නැති නිසා, විවාදයකට කරුණු මන්ත්‍රීවරු දැන ගන්න අවශ්‍යායි. ඒ නිසා මේක ඊළඟ සභාවට යොමු කරන්න.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------------

එහෙම නම් ඊළඟ සභාවේ දී මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා දැනුම් දෙනවා.

පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු :

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
------------------------------------------------------------

මේ යටතේ පළමුව තිබෙන්නේ මා විසින් ඉදිරිපත් කරපු යෝජනාවක්. ඒක මට මේ අවස්ථාවේ ඉදිරිපත් කරන්න බැරි නිසා තුල්හිරිය, පූගොඩ පෙහෙකම්හලේ 78 රැකියා අහිමි වූවන් වෙනුවෙන් මේ වෙනකොට මධ්‍යම පළාත් සභාවත්, දකුණු පළාත් සභාවත් ඒකමතිකව යෝජනාවක් සම්මත කරලා තියනවා. ඒ වගේම 2396 දෙනෙකුගේ රැකියා අහිමි වෙලා තියනවා. එම පළවෙනි යෝජනාව 15 (1) යටතේ යෝජනා අංක 01 යටතේ 6/1/2017/09 දරණ යෝජනාව සම්බන්ධයෙන් මේ අවස්ථාවේ දී අපේ නමින්ද මන්ත්‍රීතුමාට අවස්ථාව ලබාදෙනවා.

*ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය* *கௌரவ நமிந்த அனுரபிரிய* *Hon.Member Naminda Anurapriya*
------------------------------------------------------------

ගරු සභාපතිතුමනි, ජාතික පේෂකර්ම සංස්ථාවට අයත්ව තිබූ තුල්හිරිය සහ පූගොඩ පෙහෙකම්හල් දෙක පුද්ගලික අංශයට ලබාදීම හේතුවෙන් එම කම්හල් දෙකේ සේවකයින් 2396 කගේ රැකියා 1978 මාර්තු මස 18 දින සිට අහිමි විය.

1994 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා එවකට පැවති රජයන් විසින් මෙසේ රැකියා අහිමි වූ සේවකයන් හට කරුණා සහගත දීමනා පමණක් ගෙවා තිබේ. ඒ අනුව එක් සේවකයෙකුට ලැබී තිබෙන මුදල රු.60,000 ක් පමණි. 1978 පෙබරවාරි මස 04 වන දින රැකියා අහිමි වූ ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න මහතාට රුපියල් ලක්ෂ 60 ක වන්දියක් ද, 1980 ජූලි වර්ජකයින් සඳහා එත් අයෙකුට රුපියල් ලක්ෂ 2 ½ ක වන්දියක් ද යහපාලන රජය මඟින් ගෙවා ඇත.

එබැවින් මෙම තුල්හිරිය, පූගොඩ රැකියා අහිමි වූ සේවකයින්ට ද සාධාරණ වන්දි

මුදලක් ගෙවීම සුදුසු බවට මා මේ ගරු සභාවට යෝජනා කරමි.

ඒ වගේම ගරු සභාපතිතුමනි, විශේෂයෙන් මතක් කරන්න ඕන ජාතික පේෂකර්ම සංස්ථාවට අයත්ව තිබූ තුල්හිරිය හා පූගොඩ පෙහෙකම්හල් 1978 වර්ෂයේ දී පෞද්ගලික අංශයට පැවරීමත් සමඟ ඇති වූ කාර්මික ආරවුල මත තුල්හිරි කම්හලෙන් 2051 ක් ද, පූගොඩ කම්හලෙන් 345 ක් ද එකතුව 2396 දෙනෙකුගේ දේශපාලන පළිගැනීම් මත සිය කැමැත්තෙන් රැකියාව අතහැර ගියා සේ සළකා රැකියාවෙන් නෙරපා හරින ලදී. රැකියා අහිමි වූ සියළු සේවකයින් කම්කරු දෙපාර්තමේන්තුවට හා පසුව කම්කරු විනිශ්චය සභාව වෙත ගොස් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග තුළින් විසඳුමක් අපේක්ෂා කළමුත් ජාතික පේෂකර්ම සංස්ථාව රජයට පවරා ගත් වෙළඳ ව්‍යාපාරයක් බවට පත් කිරීම නිසා නීත්‍යානුකූල ක්‍රියා මාර්ගයක් ගැනීම තිබූ අවස්ථාව අහිමි විය. 1993 මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉදිරිපත් වීමෙන් පසු තුල්හිරිය, පූගොඩ සේවකයින්ගේ රැකියා අහිමි කිරීම නීත්‍යානුකූල නොවන බවට තීරණය වීම මත 1994 වසරේ දී ඩී.බී.විජේතුංග ජනාධිපතිතුමා විසින් එක් අයෙකුට රු.10,000 බැගින් වූ මුදලක් කරුණා සහගත දීමනාවක් වශයෙන් ලබාදීමට අමාත්‍ය මණ්ඩලය කටයුතු කළා. 1994 වසරේ පොදුජන එක්සත් පෙරමුණ බලයට පත්වීමෙන් පසු තුල්හිරිය, පූගොඩ සේවකයින්ගේ රැකියා අහිමි වීම පිළිබඳව සොයා බැලීමට කමිටු දෙකක් පත් කරන ලදී. 1996 දී ඒ.එල්.එම්.ප්‍රනාන්දු මහතා හිටපු මහාධිකරණ විනිසුරුතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් ද, 1998 මුදල් අමාත්‍යාංශයේ, කම්කරු අමාත්‍යාංශයේ සහ කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්තුමන්ලාගෙන් සමන්විත දෙවන කමිටුවක් ද පත් කරන ලදී. එම කමිටුවල තීරණ ප්‍රසිද්ධ නොකළ අතර, සැබෑ වන්දි මුදලක් ලබාදෙන තුරු 1999 වසරේ දී ජනාධිපතිවරණයට ප්‍රථමත් තවත් රු.25,000 ක කරුණා සහගත දීමනාවක් ලබාදුන්නා. ගරු සභාපතිතුමනි, සම්මුති ආණ්ඩු බලයට පත් වුනාට පස්සේ දේශපාලන හේතූන් මත අසාධාරණයට ලක්වූවන්ට සාධාරණත්වයක් ලබාදී ඇත. එය ඉතාම අගය කළයුතු කාරණයකි. ඒත් රැකියාව අහිමිව දශක තුනක් ඉක්මවා ගොස් ඇති තුල්හිරිය, පූගොඩ සේවකයින් හට වරින් වර ලබාදුන්න 1987 රු.10,000 හා 99 වසරේ 25,000, 2015 දී 25,000 කරුණා සහගත දීමනා හැර සැබෑ වන්දි මුදලක් හෝ පාරිතෝෂික මුදලක් මේ වෙනකොට ලැබිලා නෑ. දැනට වයස අවුරුදු 60 ඉක්මවා ඇති සියළුම අය ඉතාම අසරණ තත්ත්වයට පත්වී ඇත. සේවය අවසන් කිරීමේ පනත යටතේ නීත්‍යානුකූලව හිමි, අහිමි, හිමි පාරිතෝෂික දීමනා යටතේ නීත්‍යානුකූලව හිමි පාරිතෝෂික මුදල ද තුල්හිරිය, පූගොඩ සේවකයින් හට නොලැබීම මත සේවයෙන් ඉවත් කිරීම හෝ විශ්‍රාම ගැන්වීමේ දී නීත්‍යානුකූලව ලැබිය යුතු පාරිතෝෂික මුදල රැකියා අහිමි වීමෙන් අසරණභාවයට පත්ව ඇති තුල්හිරිය, පූගොඩ සේවකයින් හට ලබා දීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමනි, මේ සභාවට යෝජනා කර සිටිනවා. මම ඉල්ලා සිටිනවා මේක අනුමත කරලා, සම්මත කරලා දෙන්න. මොකද හෙට අනිද්දා මැයි දිනයත් එනවා. 80 දශකයේ ඒ කාලයේ වෙච්ච දේවල් නැවත හෝදා හෝදා මඩේ දාන්න අවශ්‍යතාවයක් නෑ. නමුත් මේ කටයුත්ත සඳහා පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව සියළුදෙනාගේම අනුමැතිය ලබාදෙන්න කියන යෝජනාව මම ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි.

*ගරු අමාත්‍ය රංජිත් බණ්ඩාර මැතිතුමා.* *கௌரவ அமைச்சர் ரஞ்ஜித் பண்டார* *Hon. Minister Ranjith Bandara* -----------------------------------------------------

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා. ඒ වගේම එම යෝජනාවට කුරුවිට කේටෙක්ස් ආයතනයත් ඇතුළත් කරගන්නා හැටියට ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

*ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.*
*கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன*
*Hon.Gov.Whip Asoka Jayawardane*
*-------------------------------------------------------*

ගරු සභාපතිතුමනි, මේ යෝජනාවට අදාළ වෙන සමහර සේවකයින් මේ වෙනකොට

ජීවතුන් අතර නෑ. ඒ නිසා ඒ අයගේ එම දීමනාව ඒ අයගේ යැපෙන්නන්ට දීමට කටයුතු කරන ලෙස යෝජනා කරනවා.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*
*Hon.D.Chairman Udayakantha Gunathilaka*
*--------------------------------------------------------------*

එහෙම නම් අපි මේ අවස්ථාවේ දී එම යෝජනාව අපි ඒකමතිකව සම්මත කරලා යවන්න අවශ්‍ය කටයුතු කරනවා. සානුකම්පිත ප්‍රශ්නයක්. ඒ නිසා මෙම යෝජනාව ඒකමතිකව සම්මත වුනා සේ සළකනවා. විපක්ෂනායකතුමා ප්‍රධාන විපක්ෂයට මම ස්තුතිවන්ත වෙනවා ඒ සඳහා ලබාදුන්න සහයෝගය පිළිබඳව විශේෂ ස්තුතියක් මේ අවස්ථාවේ ලබාදෙනවා.

ඊළඟට ගරු විපක්ෂයේ සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමාගේ යෝජනාව.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல Hon.Opposition Whip Siripala Kiriella* *--------------*
*---------------------------------------*

ගරු සභාපතිතුමනි, පානීය ජලය විදෙස් රටවලට යැවීම හා මෙරට අළෙවි කිරීම ගරු සභාපතිතුමනි. ශ්‍රී ලංකාව විවිධ ස්වභාවික සම්පත්වලින් සපිරි වාසනාවන්ත රටකි. එම සම්පත් අතුරෙන් පානීය ජල සම්පත ද අපේ රටට විශේෂ වශයෙන් ලැබී ඇති, මිනිසා ජීවත් කරවීමට අත්‍යාවශ්‍ය වන සම්පතකි.

මෙම පානීය ජලය පිරිසිදු කර බෝතල් වශයෙන් අළෙවි කිරීමේ කර්මාන්තය ආරම්භයේ දී අඩු අවධානයකට ලක් වුවත් අද වනවිට විවිධ ව්‍යාපාර ආයතන ඒ සඳහා ඉදිරිපත්ව ඇත. මෙමගින් යම් පිරිසකට රැකියා අවස්ථා ලැබී ඇති අතර, එය දේශීය ව්‍යාපාරයක් ලෙස දියුණු වෙමින් පවතී.

මෙම පානීය ජලය බෝතල් කර අළෙවි කිරීමේ ව්‍යාපාරය පළාත් සභා තුළින් ආරම්භ කොට ජල බෝතල් විදෙස් රටවලට අළෙවි කිරීමෙන් තරුණ තරුණියන්ට රැකියා අවස්ථා උත්පාදනය කිරීමට හැකිවන අතර, පළාත් සභාවල ආදායම වැඩි කර ගැනීමට ද හැකිවේ. එසේම එමගින් රටට ලැබෙන විදේශ විනිමය ආදායම ද ඉහළ නංවා ගැනීවමට හැකිවනු ඇත.

එබැවින් පානීය ජලය බෝතල් කිරීමේ කර්මාන්තය සියළුම පළාත් සභා මඟින් ගරු සභාපතිතුමනි, අපි මේක යෝජනාවක්. ඒවා කරයිද නොකරයිද අපි කියන්න දන්නේ නැහැ. හැම පළාත් සභාවක්ම මේ ගැන අවධානය යොමු කරලා මේ කාරණය ඉටු කළොත් ගරු

සභාපතිතුමනි, අපට විශාල මුදල් සම්භාරයක් මේ රටට අයිති කරගන්න පුළුවන් වෙනවා. මේක් විදේශ රටවලට අරිනවාත් එක්කම ලංකාවෙත් පුළුවන් වෙනවා මේ ජල බෝතල් කරලා මේක අළෙවි කරන්න තියනවිට. දැන් අද ගත්තාම පෞද්ගලික ආයතන රාශියක් මඟින් මේ ජල බෝතල් කිරීම ව්‍යාපෘතිය කරගෙන යනවා ගරු සභාපතිතුමනි. මේක රජයේ සම්පතක් විදිහටයි ගරු සභාපතිතුමනි, මම දකින්නේ. රජයේ සම්පතක් වුනාම මේක රජය හරහා මොකද පළාත් සභාව හරහා මේක කළොත් විරැකියාවට පිළියමක් වෙනවා එකක් ගරු සභාපතිතුමනි. සාමාන්‍ය පෙළ සමත් ළමයා, උසස් පෙළ සමත් ළමයා, උපාධිධාරියා මේ හැම කෙනෙකුටම ගත්තාම යම් ප්‍රමාණයකට හෝ රැකියා විරහිතභාවයෙන් පෙළෙන අයට රැකියා ලැබීමේ කටයුත්ත වෙනවා. ඒ එක්කම පිටරට අරිනකොට විනිමය

ගලාගෙන එනවා ගරු සභාපතිතුමනි. මොකද බෝතල් කරලා වතුර අරින අයගෙන් ඒ එක්කම රජයට 50% ක් තියාගත්තා නම් ගරු සභාපතිතුමනි, මේක විශාල ආදායම් මාර්ගයක් තමයි රජයට.

විවිධ හේතූන් මත ගත්තාම අද අපට ආදායම අඩු වෙනකොට ආදායම වැඩි කර ගැනීම සඳහා, අපට සබරගමුව පළාත් සභාවේ ආදායම වැඩි කර ගැනීම සඳහා මේක උපයෝගී කරගන්නවා නම් ඉතාම වැදගත් වෙනවා ගරු සභාපතිතුමනි. ඒ යෝජනාව මම ඒ විදිහට ගෙනාවේ අපට මේ සම්පතින් රටට සෙතක් ලාභයක් ඇති කර ගන්නයි ගරු සභාපතිතුමනි. අපට කියන්න බෑ අනෙක් පළාත් සභා මේ ගැන කොහොම ක්‍රියා මාර්ග ගනියි ද කියලා. නමුත් අපේ පළාත් සභාව මඟින් මේ දේ කරන්න පුළුවන් නම් සමහරවිට තමුන්නාන්සේලා කියන්න පුළුවන් මේක රජයට අයිති දෙයක්. පළාත් සභාවලට අයිති නෑ කියලා. එහෙම නම් ගරු සභාපතිතුමනි, රජය දැනුවත් කරන්න මේ සම්බන්ධයෙන් ආදායම් මාර්ගයක් ඉතා කඩිනමින් මේක ක්‍රියාත්මක කරන්න කියන ඒ යෝජනාව තමයි කළේ ගරු සභාපතිතුමනි.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka* ---------------------------------

බොහොම ස්තුතියි ගරු විපක්ෂ සංවිධායකතුමනි. මීළඟට ගරු මන්ත්‍රී සමිත ආටිගල මැතිතුමා. එතුමා සභාවේ නැහැ. ගරු මන්ත්‍රී යෙහෙයියා එම්.ඉෆ්ලාර් මැතිතුමා. එතුමා මේ අවස්ථාවේ සභාවේ නැහැ. අජිත් ශාමින්ද ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

***ගරු මන්ත්‍රී අජිත් ශාමින්ද***
*கௌரவ உறுப்பினர் அஜித் ஷாமிந்த* *Hon.Member Ajith Shyaminda* ----------------------------------

ගරු සභාපතිතුමනි සිරිපාල කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න කාලය ලබාදීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. මං හිතන්නේ ගරු මන්ත්‍රීතුමා පරිසරයට ආදරය කරන ගරු මන්ත්‍රීවරයෙක් විදිහට ඉතාම වැදගත් යෝජනාවක් ගෙනල්ලා තියෙන්නේ. නමුත් අපිට අපේ පළාත විදිහට මේ වෙලාවේ පහුගිය කාලයේ ඊයේ පොඩ්ඩක් නම් වැස්සා. පහුගිය කාලයත් එක්ක තිබ්බ්චි තත්ත්වයත් එක්ක පිටරට වතුර යවන්න ඉස්සෙල්ලා අපේ පළාතේ ජනතාව ගැන හිතන්න වෙනවා ගරු සභාපතිතුමනි. මොකද විශේෂයෙන් අපිට ගරු මන්ත්‍රීතුමා ඉන්න ප්‍රදේශයට අල්ලපු ප්‍රදේශයේ දැරණියගල පනාවල ප්‍රදේශයේ මානියංගම ,ඇහැලියගොඩ අල්ලපු ප්‍රදේශවල ජනතාවට පානිය කරන්න ජලය පහුගිය කාලයේ

තිබුණේ නෑ. අර සභාවේ යෝජනාවක් ගෙනාවා නොමිලයේ බවුසරයක් දෙන්න කියලා . ඒ පිහිටෙන් තමයි වතුර ටිකක් ගෙනිහිල්ලා ඒගොල්ලෝ දවස් ගාණකට ඇති වෙන්න ගබඩා කරගෙන පානය කලේ. ගරු සභාපතිතුමනි මේක අපිට ඉස්සර නම් රට ගත්තහම වතුර ඕන තරම් හොඳ වතුර තිබුණා. නමුත් මේ සමහර අපිට මේ ආර්ථික රටාවත් එක්ක එහෙම නැත්නම් හැම තැනම තේ වගා කරලා. සමහර විට කඳු හෙල් ඔක්කෝම එළි කරලා. අපිට ඒ නිසි ජලය අද හරියාකාරව ලැබෙන්නේ නෑ. සතියක්, දෙකක් ,දවස් පහක් පැවුවොත් අද ගරු සභාපතිතුමනි ළිං හිඳෙන තත්ත්වයට පත් වෙලා තියෙනවා. ඒ නිසා අපිට මේ යෝජනාව ඉතාම වැදගත් එතුමා යෝජනා කරන්නේ අපේ පළාතේ නිෂ්පාදනය කරලා පිටරට යවන්න. නමුත් අපේ රටටත් පිටරට යවන්න අවශ්‍ය නෑ වතුර හැදුවොත් අපිට එහා පැත්තේ හම්බන්තොට එහා පැත්තට ගත්තහම

එතුමාගේ යෝජනාව හැල්ලුවට ලක් කිරීමක් නෙමෙයි ගරු සභාපතිතුමනි කලේ. එතුමා මම දන්නවා පරිසරයට ආදරෙයි එතුමා ඉන්න ප්‍රදේශයේ වුණත් ගස් හිටවලා එතන හොඳට ජල උල්පත් රැක ගන්න කටයුතු කරන මන්ත්‍රීවරයෙක්. එතුමාගේ යෝජනාව හැල්ලුවට ලක් කිරීමක් නෙමෙයි. නමුත් අපේ ජනතාව පැත්තෙන් ගත්තහම මට මතකයි පහුගිය කාලයේ සීතාවක ගඟෙන් වතුර අරගෙන මානියංගම ප්‍රදේශය හරහා වතුර අරගෙන ඇහැලියගොඩට වතුර දෙන්න සැලැස්මක් හැදුවා. ඒක දැන් මේ වනවිට නැවතිලා තියෙන්නේ. ඒවා අපි ඉදිරියට ගන්නට ඕනේ. අපි දන්නවා අපේ ජනතාව ඉතාම අපහසුතාවයට පත් වෙනවා මේ ජලය අනිත් මොනම දේටත් වඩා කාන්තා පාර්ශවය අපහසුතාවයට පත් වෙනවා නිසි අයුරින් මේ ජලය ලබා ගන්න බැරි වුණහම. ඒ නිසා අපි යෝජනා කරන්නේ මේ පළාත පිළිබඳව සමීක්ෂණයක් කරලා මේ වනවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දත්ත සැලසුම්

අනුරාධපුර,පොළොන්නරුව දිහාටත් අද පහුගිය කාලයේ බොන්න වතුර නැතුව තියෙන තත්ත්වයක් තිබුණේ. ඒ නැතත් අද සබරගමු පළාතේම ලොකු ජල ප්‍රශ්නයක් තියෙනවා. අපිට අර යම් සීමාවල වතුර ඕන තරම් තිබුණට උස් බිමක් අරන් බැලුවහම ඒ ප්‍රශ්නය තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි මම කල්පනා කරනවා එතුමා කරපු යෝජනාව ඉතා වැදගත්. මේ යෝජනාව අල්ලගෙන අපේ පළාතේ මූලිකවම අපේ පළාතේ ජනතාවට නිසියාකාරව පානීය ජලය ලැබෙන්න යම් වැඩ පිළිවෙලක් සකස් කළ යුතුයි. නැත්නම් අපි ඉඩෝර කාලයට විතරක් මේක කතා කරලා හරි යන්නේ නෑ. ඒ තත්ත්වය දියුණු කරගෙන ඉදිරි කාලයේදී හරි අපේ පළාත ස්වයංපෝෂිත කර ගත්තාට පස්සේ අපිට පුළුවන් වෙයි අනිත් පළාත්වලට දෙන්න එහෙම නැත්නම් පිට රටටත් මේක ආයෝජනය කරන්න. එතුමා යෝජනා කරන්නේ පළාතේ නිෂ්පාදනය කරලා පිට රටටත් යවන්න. ඒක හොඳ යෝජනාවක්. නමුත් ඊට ඉස්සෙල්ලා අපේ පළාතේ ජනතාව ගැන හිතන්න ඕනේ කියන එක ගරු සභාපතිතුමනි හිතන්න ඕනේ. ඒ නිසා

තියෙනවා. ඒවා ටික කැඳවාගෙන මේවා ගැන වෙනම සාකච්ඡාවක් කරලා අපි අවශ්‍ය නම් පළාත් සභාව සහ ජල සම්පත් අමාත්‍යාංශය ඒකාබද්ධ වැඩ සටහනක් කරලා ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ජල අවශ්‍යතාවයන් තියෙන තැන් හඳුනාගෙන ඒවාට ජලය සැපයීමට නිසියාකාරයෙන් වැඩ පිළිවෙලක් සකස් කරලා ඒකට අවශ්‍ය කටයුතු කරලා දෙවනුව අපි ඉදිරියේදී අපේ පළාතෙන් වෙනත් පළාත් වලට වතුර දෙන්න එහෙමත් ඉතුරුවක් තියෙනවා නම් පිටරට යවන්න පුළුවන් තත්ත්වයට ඒ ගේන්න එතුමාගේ මේ යෝජනාව මූලික කරගෙන වැඩ සටහනක් කරමු කියන එක මමත් යෝජනා කරමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*

*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.Chairman Udayakantha Gunathilaka* --------------------------------

------------------------------------------------------------

බොහොමත් ස්තූතියි ගරු අජිත් ශාමින්ද මන්ත්‍රීතුමනි . මීළඟට රංජිත් පොල්ගම්පොල මන්ත්‍රීතුමාට අවස්ථාව. එතුමා සභාවේ නැහැ. සභාවේ මන්ත්‍රීවරුන්ට මම දැනුම් දෙන්නේ මේ වනවිට ටීවී එකේ තිරයේ උදේ කථික නාම ලේඛණය ප්‍රදර්ශනය වෙනවා. එහෙම තිබිලත් මන්ත්‍රීවරු සභාවේ නැති එක ගැන කණගාටු වෙනවා. මීළඟට ගරු මන්ත්‍රී බී.ආරියවංශ මැතිතුමාට අවස්ථාව.

*ගරු මන්ත්‍රී බී.ආරියවංශ* *கௌரவ*
*உறுப்பினர் பீ.ஆரியவங்ஷ* *Hon.Member*
*B.Ariyawansha* ------------
---------------------------------

ගරු සභාපතිතුමනි සිරිපාල කිරිඇල්ල අපේ සංවිධායකතුමා කරපු යෝජනාව ඉතා වැදගත් යෝජනාවක්. ජලය තමයි අපිට ආහාර නොගෙන දවස් ගණනක් හිටියත් ජලය නොමැතිව ඉන්න බෑ. එහෙම තමයි අපේ රටේ 45% වගේ පිරිසිදු පානීය ජලය තියෙන්නේ. ඒවගේම මෙතුමා යෝජනා කලා අපේ ප්‍රදේශයේ සබරගමුව පළාත් සභාව තුළ මේ ජල බෝතල් කරන ව්‍යාපෘතියක් ආරම්භ කරලා ඒ තුලින් අපේ රටටත් ඒවගේම ඒ වැඩිපුර ප්‍රමාණය විදේශ රටවලටත් අලෙවි කිරීම සඳහා ගෙනාපු යෝජනාවක්. ඒක ඉතාම වැදගත් යෝජනාවක්. අපේ අජිත් ශාමින්ද ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා අපේ ප්‍රදේශයේ අයටත් ජලය නෑ. ඒ අයට පිරිසිදු පානීය ජලය ලබාදීමේ වැඩ පිළිවෙලකුත් මේ සමානව දියත් කරන්න ඕනේ කියලා. ඒවගේම මම සඳහන් කරන්න ඕනේ මේ ජලය ලැබෙන ප්‍රදේශයක් වශයෙන් අපි දන්නවා අපේ රටේ විශේෂයෙන්ම සිංහරාජ අඩවිය ඒවගේම සිංහරාජ ලෝක උරුමයක් වූ වනාන්තරය දීර්ඝ කාලයක සිටම මේ වන කොට විනාශයට පත් වෙලා අද සුළු භූමි ප්‍රමාණයක භාගයක පවතින වනාන්තරයක් බවට පත් වෙලා තියෙනවා. ඒ ප්‍රදේශවල අපි දැක්කා ඒ අවට ගම්මාන වලටත් පසුගිය කාලයේ නියගයත් සමග ජලය හිඳී ගොස් බොහොම දුර ප්‍රදේශ වලින් ජලය ගෙල්ලා බවුසර් වලින් බෙදුවා. ඒවගේම තමයි ගොංගල ප්‍රදේශයේ ආරම්භ වෙන ගිංගඟ දකුණු පළාතෙන් මුහුදට වැටෙනවා. මේ වනවිට එයින් කිසිම ස්ථානයක වැවක් හෝ එහෙම නැත්නම් ඒ ප්‍රදේශයේ කුඹුරු හෝ කිසිම තැනකින් ප්‍රයෝජනයට ගන්නේ නෑ. මුහුදට වැටිලා එතනින් මුහුදට එකතු වෙලා යනවා. ඒවගේ ස්ථාන තියෙනවා. මොකද සබරගමු පළාත් සභාව වගේ ගොංගල සිංහරාජ අඩවියේ ඒ ආරම්භ කරන ජල මූලාශ්‍රය තුළින් අපි පහුගිය දවස්වල ගියා. ඒ ජලය කෙලින්ම බැහැලා මුහුදට යනවා. අපි අන්න ඒවගේ ස්ථාන තෝරාගෙන ඒවගේ පිරිසිදු ජලය ,පිරිසිදු පානීය ජල ව්‍යාපෘතියක් ආරම්භ කරලා ඒතුළින් අපිට පුළුවන් මේ රටේ සෑම ස්ථානයකින්ම ජලය නැති ප්‍රදේශ වලට ඒ පිරිසිදු පානීය ජලය නිෂ්පාදනය කරලා ලබාදීමටත්. ඒවගේම ඒ ජලය මේ රටේ පාවිච්චියට වඩා විදේශ රට වලට යොදවලා

අපේ රටට යම් ආදායමක් ලැබෙන අවස්ථාවක්. ඒ නිසා එතුමාගේ යෝජනාව මම ස්ථිර කරනවා. ඒවගේම අපි අද බැලුවොත් කඩෙකට ගිහිල්ලා බැලුවොත් ජල ලීටරයක මිළ රුපියල් හැටක් හැත්තෑවක් වගේ මුදලක්. ඒවගේම අපි සෙඩ් එකකට ගිහිල්ලා බැලුවොත් අද භූමි තෙල් ලීටරයක මිළ පැට්‍රල් ලීටරයක මිළ ඒවගේම ඩීසල් ලීටරයක මිළ හා සමානව අද මේ රටේ ජලය ලීටරයක මිළ තීරණය කරලා තියෙනවා. ඒ නිසා අපිට පුළුවන් වෙනවා අපේ පළාත් සභාව තුළින් එහෙම නැත්නම් අපේ රජය තුළින් මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කරලා මේ රටේ සිටින ජනතාවට අඩු මුදලකට පිරිසිදු පානීය ජලය ලබාදීම සඳහා යම් වැඩ පිළිවෙලක් සකස් කිරීම සඳහා. ඒ සඳහා තමයි අපේ මෙතුමාගේ යෝජනාවේ තිබෙන්නේ. ඒ නිසා ඒ යෝජනාව ස්ථිර කරනවා. සබරගමු පළාත් සභාව තුළ මෙය ස්ථිර කරලා වැදගත් යෝජනාවක් ලෙස පත් කරලා මේ රටේ සිටින ජනතාවට රුපියල්

හැටට හැත්තෑවට ලබා දෙන පෞද්ගලික අංශ මගින් නිෂ්පාදනය කරන පිරිසිදුයි කියලා ඒ සඳහන් කරන ජල බෝතලයක් රුපියල් හැටට හැත්තෑවට අලෙවි කරන වතුර බෝතල් අපේ පළාත් සභාවෙන් රුපියල් තිහකට හතළිහකට වගේ අඩු මුදලකට ලබාදීමට යම් වැඩ පිළිවෙලක් හැදුවොත් අපේ පළාත් සභාවටත් ආදායමක් ගන්නවා වගේම අපේ රටේ ඉන්න ප්‍රදේශයේ ඉන්න ජනතාවටත් යම් සහනයක් සැලසෙනවා කියලා ප්‍රකාශ කරමින් මෙතුම ගෙනාපු යෝජනාව ස්ථිර කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා . ස්තූතියි.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman Udayakantha Gunathilaka* ---------------------------------------------------------------------------------

බොහොම ස්තූතියි බී.ආරියවංශ ගරු මන්ත්‍රීතුමනි. මීළඟට රම්‍යකුමාර වීරසිංහ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ* *கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க* *Hon.Member Ramya Kumara Weerasinghe* -------------------------------------------------------

ගරු සභාපතිතුමනි මම අපේ සිරිපාල කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව එක පැත්තකින් ගත්තහම අපි සභාවක් හැටියට අගය කරන්න ඕනේ ඇත්තටම සභාවේ ආදායම වැඩි කරන්න. සභාවට සහ රටට ගේන්න ගෙනාපු හොඳ යෝජනාවක් හැටියට එක පැත්තකින් මේ යෝජනාව අගය කරන්න ඕනේ. ඒවගේම අපිට යුතුකමක් තියෙනවා මේ යෝජනාව සම්බන්ධව එතුමා මේ පළාත් සභාවේ දීර්ඝ කාලයක් කටයුතු කරපු මන්ත්‍රීවරයෙක් හැටියට විපක්ෂ සංවිධායකවරයෙක් හැටියට එතුමා සභාවේ අනාගතය දිහා බලාගෙන සභාවේ ආදායම වැඩි කරන්න ගත්ත ඒ ආකල්පය ඒ අදහස අපි අගය කරනවා. ඒවගේම මේ යෝජනාවේ තවත් පැත්තක් තියෙනවා. මේ යෝජනාවේ සම්පූර්ණයෙන් ගත්තහම තරුණ තරුණියන්ට රැකියා අවස්ථා උත්පාදනය කිරීමට හැකි වෙනවා කියන කාරණාව. ඒ කාරණාව ඇත්ත. ඇත්තටම මේකෙන් තරුණ තරුණියන්ට රැකියා අවස්ථාවක් යම් ප්‍රමාණයට උත්පාදනය කරන්න හැකිවෙනවා . හැබැයි මේකෙන් ගම්‍ය වෙනවා වෙන කාරණාවක්. රැකියා දස ලක්ෂයක් දෙනවා කියලා දෙන්න බැරි වෙච්චි මධ්‍යම රජයේ අසමත්භාවයට පළාත් සභාව හරහා පිළිතුරු සෙවීමේ උත්සාහයත් මේකෙන් ගම්‍ය වෙනවා. ඒ එක්කම ආදායම වැඩි කරනවා කියන කාරණාව මේ යෝජනාවේ අන්තර්ගතය වෙනවා. එතකොට රජයේ ආදායම වැඩි කර ගැනීම සඳහා තිබ්බිච්චි වරාය විකුණලා එක සැරේ සල්ලි අරගෙන අර රත්තරං බිත්තර දාන කිකිළිගේ බඩ පැලුවා වගේ වරාය විකුණලා තෙල් ටැංකි විකුණලා සිංහරාජය එහෙම විකුනන්න ඉඩ තියෙනවා ඉස්සරහදී. ඒ ටික කරන ගමන් ඒත් බැරි කොට වතුර ටික හරි විකුණලා ආණ්ඩුව ආදායම වැඩි කර ගන්න ගන්න උත්සාහයක්ද කියලා තව පැත්තකින් මේ යෝජනාව ඇතුළේම එහෙම තවත් අදහසක් ප්‍රකාශ වෙනවා. එතකොට තමයි අර විදේශ විනිමය කියන කාරණාව මතු වෙන්නේ. මේ යෝජනාව ඉදිරිපත් කිරීමේදී ගරු සභාපතිතුමනි පුංචි වැරැද්දකුත් මට පේනවා. ඒකත් කියන්නට ඕනේ. ඒ තමයි සියළුම පළාත් සභා මගින් ආරම්භ කරලා මධ්‍යම රජය මගින් විදේශ වල්වලට අපනයනය කිරීමටයි

යෝජනා කරන්නේ. දැන් අපිට සබරගමු පළාත් සභාව හැටියට පුළුවන්කමක් නෑ සියළුම පළාත් සභා වලින් ආරම්භ කරන්න. අපිට පුළුවන් අපේ පළාත් සභා වලින් ආරම්භ කරන්න. අනිත් පළාත් සභා වලින් ආරම්භ කරලා මහ ආණ්ඩුව හරහා විදේශගත කරන්න නෙමෙයි මේක කරනවා නම් කරන්න ඕනේ. අපිට එහෙම කරන්නත් බෑ අනිත් පළාත් සභා වලින් තීන්දු ගන්න. මේ පළාත් සභාවෙන් කරනවා නම් කරන්න තියෙන්නේ අපි වැඩේ පටන් අරන් අපිම විදේශ රටවලට අපනයනය කිරීම සඳහා වූ වැඩ පිළිවෙලක් සකස් කිරීම. මේ කාරණා ටිකට අමතරව ගරු සභාපතිතුමනි විශේෂයෙන්ම මම මතක් කරන්න ඕන කාරණාවක් තියෙනවා. සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමාගේ මේ යෝජනාව එන කොටම සභා කටයුතු කාරක සභාවේ නියෝජිතයෙක් හැටියට මමත් ගේනවා යෝජනාවක්. මේ යෝජනා දෙකම එන්නේ එකට. හැබැයි අද න්‍යාය පත්‍රයට ඇතුළත් වෙන්න තිබුණේ ඒ යෝජනාව පසුගිය රැස්වීම්වල කතා නොකරන ලද යෝජනා ඉදිරියට පැමිණීම නිසා මගේ යෝජනාව පොඩ්ඩක් පස්සට ගිහිල්ලා තියෙනවා. ඒක නිසා ගැටළුවක් නෑ. ඒක නීත්‍යානුකූල පැත්තෙන් හානියක් නෑ. එහෙම ප්‍රශ්නයක් නෑ. හැබැයි ඒ යෝජනාව මට මතක් වෙනවා. මම නිකන් ඊළඟ සභාවේ ඒ යෝජනාව කියවන්න ලෑස්ති වෙල ඉන්න ගමන් ඒ යෝජනාව ඉදිරිපත් කරන්න ලෑස්ති වෙලා ඉන්න ගමන් විශේෂයෙන්ම මෙවැනි අවස්ථාවකදී සභාවට ඉදිරිපත් විය යුත්තේ සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමාගේ යෝජනාවද. රම්‍යකුමාර මන්ත්‍රීතුමාගේ යෝජනාවද කියන කාරණාව විශේෂයෙන් සියළු දෙනාගේ අවධානයට ලක්වීම සඳහා මම ඉදිරිපත් කරන්න සූදානම් කරලා යෝජනා අකං 6/1/2017/14 කියලා ලබන සභා වාරයට ඉදිරිපත් වෙන්න තියෙන යෝජනාවේ නිකන් පොඩ්ඩක් මම මේ වෙලාවේ කියනවා. සබරගමු පළාතේ පානීය ජල අර්බුදය මේ වනවිට බරපතල ගැටළුවක් බවට පත්වී ඇත. වැසි වසිමින් පැවතුණද ළිං සිඳී යාමට වෙනස් වී නොමැති අතර උල්පත් ජලය නොලැබීම හේතුවෙන් බොහෝ ප්‍රදේශවල ජනතාව ජල ගැටළුවට විසඳුම් ඉල්ලා කරනු ලබන ඉල්ලීම් දිනෙන් දින වැඩිවෙමින් පවතී. මේ සියළු තත්ත්වයන් සලකා බැලීමේදී පෙනී යන කරුණ වන්නේ ළිං සිඳී යාමේ තර්ජනයට සබරගමුවේ පත්ව ඇති බවයි. මේ සඳහා විසඳුම් සෙවීමට ඉහල තාක්ෂණික සහාය ලබා ගත යුතු බවටත් මෙම වසර දෙකක කාලය අනිකුත් සංවර්ධන කාර්යයන්ට වඩා පානීය ජල ගැටළුවට ඉහළ ප්‍රමුඛත්වයක් දී සංවර්ධන යෝජනා සකස් කිරීමේ කටයුතු කළ යුතු බවටත් සබරගමු පළාත් සභාවට මම යෝජනා කරමි.

දැන් ගරු සභාපතිතුමනි අපේ වතුර ටික පිටරටට විකුණන්න සැලසුම් කරන යෝජනාවක් මේ සබරගමු පළාත් සභාවට විපක්ෂයෙන් ගෙන එන වෙලාවේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයා හැටියට මම ගෙනාපු යෝජනාව තමයි මම කියෙව්වේ. ඇත්තටම ගමක ගිහිල්ලා බලපුවහම එදා අපිට ගමට ජල ව්‍යාපෘතියක් දෙන්න ගමට වතතුර බට ටිකක් දෙන්න කියලා ඉල්ලපු මිනිස්සු අද අපිට කියනවා ගමට වතුර බවුසරයක් එවන්න කියලා. ඉස්සර වතුර අරගන්න උල්පත් තිබුණා. අද අර කඳු ප්‍රදේශවල අනිකුත් පහත් ප්‍රදේශවල ජලය තිබිය යුතු ප්‍රදේශවල පවා ජල උල්පත් සිඳීයාමේ බරපතල තර්ජනයකට මේ සබරගමු පළාත තුළ සිටින විශාල ගම් ප්‍රමාණයක් අද හසු වෙලා තියෙනවා. මම ඊයේ පෙරේදා ගියේ එක ගමක. කිලෝමීටර් දෙක හමාරක් ඈත හිටිය පුද්ගලයා වැසිකිලියට යන්න වතුර ටික ගන්න කෑන් අත් දෙකේ උස්සගෙන කරේ ගැලුම් තියාගෙන එනවා කිලෝමීටර් දෙක හමාරක් ඇවිල්ලා තමයි තමුන්ගේ බහිස්‍රාවීය කටයුතු සඳහා වතුර ටික ගෙනියන්න පයින් ඇවිල්ලා මේක අරගෙන යන්නේ. හරියට අවශ්‍ය වෙලා මේකට ආවොත් එහෙම බහිස්‍රාවය මහදී වෙනවා. ඒ තරම්

බරපතල කාරණාවත් පානීය ජල ගැටළුව විතරක් නෙමෙයි ජලය අවශ්‍යතාවයේ පිළිබඳ ගැටළුව බරපතල ප්‍රශ්නයක් බවට මේ පළාත තුළ අද පත් වෙලා තියෙනවා. ඒ නිසා එවැනි අවස්ථාවකදී මම විශ්වාස කරනවා අප විසින් කළ යුත්තේ මුලින් මේ අහිංසක විසි එක් ලක්ෂයක් වූ ජනතාවගේ ජල ගැටළුවට උත්තර හොයලා අපේ පළාතේ ජනතාවගේ ජල ගැටළුවට උත්තර සෙවීම විනා අපේ තියෙන වතුර ටික පිට රට විකුණන මුදල් හම්බ කිරීම නොවිය යුතුයි කියලා ඒක තමයි මගේ ආකල්පය සහ මම විශ්වාස කරන විදිහට මේ පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ ආකල්පය. මේක හරියටම යූ.එන්.පී.ආණ්ඩුවේ තියෙන මේ හය පාලන ආණ්ඩුවේ තියෙන ක්‍රමවේදයත් එක්ක හරියටම ගැලපෙනවා. රටට ආදායම් හොයන්න ඕන වුණහම ඒ වෙනුවට රටට වුවමනා දේ පිට රටට විකුණලා සල්ලි හම්බ කිරීමේ යූ.ඇන්.පී.ආණ්ඩුවේ සම්ප්‍රදාය නැවත වතාවක් ගම්‍ය වෙනවා මේ යෝජනාව හරහා. මිනිස්සු බඩගින්නේ මිනිස්සුන්ට වතුර ටික බොන්න නැතුව මිනිස්සුන්ට වැසිකිලියට යන්න විදිහක් නැතුව සබරගමුවේ මිනිස්සු ඉද්දී සබරගමුවේ වතුර ටික පිට රටට විකුණලා අපි සල්ලි ගන්න ඕනේ කියලා

ප්‍රශ්නය සබගමුවේ මිනිස්සුන්ට බොන්න වතුර ටික දෙන්නේ කොහොමද සබරගමුවේ මිනිස්සුන්ට අනිකුත් අවශ්‍යතා සඳහා වතුර ටික සම්පාදනය කරන්නේ කොහොමද කියලා. ඒ නිසා මම යෝජනා කරනවා මේ සභාව මේ වෙලාවේ අපි සබරගමු පළාත් සභාව විදිහට අපිට ගන්න පුළුවන් ඉහළම තාක්ෂණික සහයෝගය ලංකාවේ හෝ ලෝකයේ කොහෙන් හරි ලබා ගෙන මේ වැසි වසිද්දී ළිං සිඳී යාමේ තර්ජනයක් අපේ පළාත තුළ ඇති වෙලා තියෙන්නේ ඇයි කියන කාරණාවට හේතු හොයන එක අපි දැන් පටන් ගන්න කාලය ඇවිල්ලා . ඒ හේතු හොයලා ඒවාට උත්තර හොයා ගන්න දැන් අපිට කාලය හරි. ඒ විතරක් නෙමෙයි ඒවාට උත්තර දිගු කාලීන පිළිතුරු හොයන ගමන් ඉතා ක්ෂණිකව මේ ගම්වල ඉන්න අහිංසක මිනිස්සුන්ගේ වතුර ප්‍රශ්නය කෙටි කාලීන විසඳුම් දැන් ඉතා කඩිනමින් ආරම්භ කළ යුතු වෙනවා. තමුන්නාන්සේලා සියළු දෙනා දන්න කාරණාවක් තමයි දැන් වහිනවා. හැබැයි වැස්සාට මිනිස්සු අපිට කතා කරලා කියන්නේ වතුර නෑ. උල්පත් තිබ්බ්බ් තැන් කිව්වහම මේ තැන්වල උල්පත් තිබුණා දැන් ඒවේ වතුර නෑ කියලා කියන්නේ. මම කියන්නේ නෑ මේක රටේ පාලකයින්ගේ තියෙන අවාසනාවන්ත

යෝජනා කරනවා අපේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක්. දැන් මේක ඒ පැත්තෙන් බලපුවහම ඉතාම බරපතල විදිහට අපේ පළාතේ අහිංසක දුගී දුප්පත් ජනතාවට එල්ල කරපු තර්ජනයක්. එහෙම නැත්නම් ඒගොල්ලන්ට එල්ල කරපු බලපෑමක් හා සමානයි. ඒ නිසා අපේ මන්ත්‍රීතුමා අපේ සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා කියන්නේ ඉතා සංවේදී පුංචි මිනිස්සුන්ගේ දුක් ගැන හොඳ සංවේදීව බලන මන්ත්‍රීවරයෙක් සමහරවිට එතුමා මේ යෝජනාව ඉදිරිපත් කරන්න හිතලා මේ යෝජනාව මුද්‍රණය කරන්න කල්පනා කරන වෙලාවේ එතුමාට මේක අවධානයට ලක් වෙන්න නැහැ. ඒ නිසා මේක ඉදිරිපත් කරන්න ඇති. ඒ නිසා ගරු සභාපතිතුමනි මේ මොහොත වනවිට මේ සබරගමුවේ තියෙන ප්‍රශ්නය සබරගමුවේ වතුර පිටරටට විකිණීම නෙමෙයි මේ මොහොත වනවිට අපිට තියෙන

අභාග්‍ය සම්පන්තකමටම වතුර උල්පත් හිඳිලා යනවා කියලා. එච්චර ද්වේශසහගත වෙන්න අපි කැමති නෑ. මොකක් හරි හින්දා මේක වෙනවා. ඒ නිසා මේක නවත්තන්න කටයුතු කරන එක පළාත් සභාව හැටියට අපිට අපේ පළාතේ අහිංසක ජනතාව වෙනුවෙන් ඉටු කළ යුතු කාර්යය භාරය වෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි සිරිපාල කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමා ගෙනාපු මේ යෝජනාවේ ඇත්තටම හොඳ පැත්තක් තියෙනවා. හැබැයි ඒ හොඳ පැත්ත තියෙනවා වුණත් මේ යෝජනාව ගේන කොට මීට වඩා වැඩියෙන් මේ පළාතේ අහිංසක දුගී දුප්පත් ජනතාවගේ පානීය සහ අනිකුත් අවශ්‍යතා සම්බන්ධ වූ ජල ගැටළුව ගැන කල්පනා කිරීම මූලික අවශ්‍යතා වෙනවා කියන කාරණාව මේ ගරු සභාවට මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
***கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக*** *Hon.D.Chairman Udayakantha Gunathilaka* ---------------------------------
----------------------------------------------------

බොහොම ස්තූතියි අපේ රම්‍යකුමාර වීරසිංහ ගරු මන්ත්‍රීතුමනි. මීළඟට අජිත් කුමාර මැද්දෙගම ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

***ගරු මන්ත්‍රී අජිත් කුමාර*** ***கௌரவ உறுப்பினர் அஜித் குமார*** *Hon.Member Ajith Kumara* ------------------------
------------------------------------

ගරු සභාපතිතුමනි අපේ රම්‍යකුමාර වීරසිංහ ගරු මන්ත්‍රීතුමාගේ කතාවෙන් පස්සේ කතා කරන්න ලැබීම ගැන ඉතාම සතුටු වෙනවා. එතුමා අපේ සිරිපාල කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමාගේ වැදගත් යෝජනාවට දෙපැත්තකින් බලලා තියෙනවා. ඒ කියන්නේ උඩින් පැත්ත ජේන එක එක ආකාරයකටත්. හැංගිලා තියෙන පැත්ත එක ආකාරයකටත්. අපිට හිතා ගන්න පුළුවන් සැඟවී තියෙන තැන මොන විදිහකට එතුමා දැකලා තියෙනවාද කියන එක ගැන. එතුමාගේ කතාවෙන් හොඳට පැහැදිලි වෙනවා. අපි කණගාටු වෙනවා එතුමා බොහොම සත්භාවයෙන් හිටපු ජනාධිපතිතුමා අනුකරණය කරමින් සහ අනුගමනය කරමින් එතුමාගේ ශක්තිය පෙන්වන ගමන් පපුවේ තියෙන ගතිය විදහා පාන්න මෙතන සැඟ වෙච්චි පැත්ත පිළිබඳව අමුතු අර්ථකතනයක් කිරීම පිළිබඳව. ඒවගේම මම කණගාටු වෙනවා එතුමාගේ ඉස්කෝලයට යන්න ලැබීම පිළිබඳව. ගරු සභාපතිතුමනි එතුමා කිව්ව රැකියා දස ලක්ෂයක් දෙන්න බැරි නිසා දැන් මේ සිරිපාල කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමා වතුර බෝතල් කරන්න යෝජනාවක් ගෙනාවා රැකියා දෙන්න ඒකෙන් උත්සාහ කරනවා. ඒ විතරක් නෙමෙයි මේ සබරගමුවේ වතුර ටික පිටරටට විකුණන්න හදනවා කියලා. ඔහොම තමයි අත හෝදන කෝප්පයේත් කිඹුල් පැටව් ඉන්නවා කියලා දැකලා තියෙන්නේ. සමහර අය බයයි. ඒක තමයි කාරණා හොයන්නේ නැතුව එක පාරටම තමන්ට ඇති වෙන භීතිය. මේක සින්රෝම් කියලා කියනවා. මානසික ප්‍රශ්නයක්. යම් යම් යෝජනා සම්බන්ධව. ඒ බැලූ බැල්මට තමන්ට මානසික රෝගයක් එක්ක බලනවා නම් අමුතු දේවල් ජේන්න පටන් ගන්නවා. උම්මාදයෙන් ජේන්න පටන් ගන්නවා. සැඟවෙච්චි පැත්තක් ගැන බලා ගන්න පටන් ගන්නවා. හැබැයි අපේ ගරු සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා එහෙම බහුභූත දෙයක් ඔළුවේ තියාගෙන යෝජනා කරලා තිබුණේ නෑ. ඒ යෝජනාව වැදගත් යෝජනාවක්. අපේ කර්මාන්ත අමාත්‍යතුමාට මේ යෝජනාව පටන් ගන්න පුළුවන්. බලනිම් කොන්ක්‍රීට් අංගනයට පටන් ගන්න කොට ඔය වගේම යෝජනාවල් ගෙනාවා. ඔය වගේම කිව්වා. මේක හරි යයිද. මේක වරදීද . මේක කරන්න පුළුවන්ද. මේ ලාභ උපදින දේවල් මේ කර්මාන්ත කරන්න පුළුවන්ද. නොයෙක් විදිහේ අභියෝග ගෙනාවා. හැබැයි ඒක අද සබරගමු පළාතේ විතරක් නෙමෙයි මුළු ලංකාවේම ප්‍රසිද්ධ කර්මාන්තයක් බවට පත් වෙලා තියෙනවා. මෙතුමාගේ යෝජනාව ක්‍රියාත්මක කරන්න පුළුවන් වුණොත් අපිට සබරගමුවේ විතරක් නෙමෙයි අර ඔබතුමා කියන මැණික් පතල් අවිදිමත් මැණික් පතල් කැනීම් කරලා අවිදිමත් විදිහට පරිසරය හානි කරලා තියෙන ප්‍රදේශවල ජල හිඟයට මුහුණ පාන ප්‍රශ්නයටත් මේකේ විසඳුමක් හොයන්න පුළුවන්. මේ යම්කිසි ප්‍රදේශයක ජලය හිඟ වෙලා තියෙනවා නම් භූගත ජල ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා නම් මේක මේ අද ඊයේ මේ ආණ්ඩුව වෙනස් වුණ නිසා සිදු වෙච්චි දෙයක් නෙමෙයි. එහෙම නම් අවුරුදු 20 ක් තිස්සේ වෙච්චි ආණ්ඩු ගැන කතා කරන්න ඕනේ. අවුරුදු 20 ක් තිස්සේ තිබුණ ආණ්ඩු මොකක්ද කරලා තියෙන්නේ. ඒවා ක්‍රමානුකූලව කරලාද කියලා බලන්න ඕනේ. එහෙම නම් එහෙම

කතා නොකර මේ අවුරුදු කීපයට මේ ආණ්ඩුවට කෙලින්ම කියලා හරි යන්නේ නැ ආණ්ඩුව ආපු ගමන් ජල උල්පත් ටික හිදිලා තියෙනවා. ඒවගේම අපි දන්නවා මේ භූගත ජල ප්‍රමාණය අඩු වෙලා තියෙනවා. ඒ අඩුවීමට හේතු අපිමයි. අපේ කරුණාපාල මන්ත්‍රීතුමා උදේ යෝජනාවක් ගෙනාවා කොළඹ කුණු කන්ද ගැන. හැබැයි කොළඹට කුණු ගේන්නේ අපිමයි. අපි තමයි වැඩියම කොළඹට යන්නේ. එහෙම නම් ඒවා දීර්ඝ කාලීනව සාකච්ඡා කළ යුතු වැඩ පිළිවෙලකට යායුතු ප්‍රශ්න. කොළඹට අපි කුණු ගිහින් දාලා එකතු වුණහම අපි කෑගහනවා මේ කුණු කන්ද එකතු වෙලා මේ ප්‍රශ්නය ඇති වෙලා තියෙන්නේ කියලා. ඒවා පළාත් පාලන ආයතන කොහේද ක්‍රියාත්මක වෙලා තියෙන්නේ කියලා. ඒවගේ මේ ජල ප්‍රශ්නයටත් කාලයක් තිස්සේ අපි අපිම කරපු යම්කිසි අකටයුතුකම් වල ප්‍රතිඵලයක් වශයෙන් මේක දකින්න ඕනේ. අපි නිවාස හදන්න ගොඩනැගිලි හදන්න එහෙම නැත්නම් නළ ළිං ගහන්න එහෙම නැත්නම් වෙනත් ක්‍රියාකාරකම් වලට විශාල වශයෙන් පොළොව කැනීම් කරපු නිසා දීර්ඝ කාලයකට බලපාලා තියෙනවා මේ භූගත ජල පරිමාව අඩුවීම . ඒක නිසා රම්‍යකුමාර මන්ත්‍රීතුමා මතක් කළා වගේ විද්‍යාත්මක ඇහින් දැකලා මේකට විසඳුම් හොයන්න අවශ්‍ය වෙලා තියෙනවා.

ඒවගේ වෙලාවක අපේ සිරිපාල කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉතාම වැදගත් වෙනවා. මොකද අපිට කෙටි කාලීනව කරන්න පුළුවන් විසඳුමක් හැටියට. එතුමා ලංකාවේ. අපේ පළාතේ අපේ දිස්ත්‍රික්කයේ ඒ ජල ප්‍රශ්නය විසඳන්න උත්සාහ කරනවා වගේම ඒ එතුමාගේ යෝජනාව තුළ ගම්‍ය වෙලා තියෙනවා මේ යෝජනාව අනිත් පළාත් සභා වලටත් දැනුම් දීලා පුළුවන් නම් ඒ පළාත් සභාත් එක්ක ක්‍රියාත්මක කරන්න. අවසානයේ අපි අතිරික්තයක් තිබෙනවා නම් ලෝකයේ විශාල ඉල්ලුමක් තියෙනවා. පහුගිය දවස්වල අපි මාලදිවයිනේ ගියා මම. ඒ ගියහම වතුර බෝතලයක් කීයක් වෙනවාද. මාලදිවයිනේ වතුර නැහැ. මාලදිවයිනට වතුර ගෙනියන්නෙ ලංකාවෙනුත් පකිස්තානයෙනුත්. ඉන්දියාවෙනුත් . එතකොට ඒ හෝටල් කාමරයකට අවුරුද්දකට ආණ්ඩුව ඒ රුපියල් වලින් ගන්නවා රුපියල් විසිදාහක්. බදු වශයෙන්. සියළු දේවල් පිටරටින් ගේන නිසා. මේ ඔක්කෝම යන විදේශියන්ට අවශ්‍ය කරන ජලය ගෙනියන්නේ ලංකාවෙනුයි, පකිස්තානයෙනුයි, ඉන්දියාවෙනුයි ඒ රටවල් තුනෙන් තමයි විශාල වශයෙන් මාලදිවයිනෙන්. අපිට හොඳ වෙළඳ පොළක් තිබෙනවා. අපේ අජිත් ශාමින්ද මන්ත්‍රීතුමා මතක් කළා වගේ අපේ රම්‍යකුමාර මන්ත්‍රීතුමා මතක් කළා වගේ ලංකාවේ වෙළඳ පොළක් තිබෙනවා. අපිට පුළුවන් නම් අපේ බාලසූරිය මන්ත්‍රීතුමා කිව්වා වගේ දැනට වෙළඳ පොළේ තිබෙන මම ඊයේ වතුර ලීටර් භාගයක් ගත්තා රුපියල් පනහයි. එතුමා කිව්වා රුපියල් හැටට විතර ලීටරයක් ගන්න පුළුවන් කියලා. සාමාන්‍යයෙන් ලීටරයක් රුපියල් සීයක් විතර වෙනවා. දැන් ඒකෙත් තියෙනවා යම්කිසි ප්‍රමිතිකරණයක්. සමහර වතුර බෝතල් තියෙනවා බිව්වහම ආයේ පාවිච්චි කරන්න බෑ. සමහර ඒවා තියෙනවා බෝතල්වල ඒවා ටික කාලයක් පාවිච්චි කරන්න පුළුවන්. යම්කිසි ප්‍රමිතියක් අනුව. මම යම්කිසි එක්තරා කඩේකින් වතුර බෝතලයක් අරගෙන වතුර බෝතලය බොන කොට මට නිකන් අඹිහිරි රසක් වගේ දැනුනා. මම බැලුවා . බලන කොට අර දින කාලය ඉකුත් වෙච්චි එකක්. එතකොට ප්‍රසිද්ධ වෙළඳ සැලක තමයි ඒක අලෙවි කරන්න දාලා තිබුණේ. අපිට එහෙම නැතුව ප්‍රමිතියක් ඇතුව ක්‍රමයක් ඇතුව වැඩ පිළිවෙලක් ඇතුව මේ ව්‍යාපාරය පටන් ගන්න පුළුවන් නම් ඒ තුළ අපිට ස්ථාවරභාවයක් ඇති කර ගන්න පුළුවන්. අද බලනිම් කොන්ක්‍රීට් අංගනයේ තිබෙන සියළුම භාණ්ඩ වලට මේ ලංකාවේ හැම තැනම පුදුම ඉල්ලීමක් තියෙනවා. අපි ඒ ගැන සංතෝස වෙනවා. අපේ වර්තමාන ඇමතිතුමාටත් මේක වුවමනාවෙන් කරන එක. අපිට ඒවගේ හැමදාම වතුර බෝතල් ගහන්න පුළුවන්. ඔය සිංහරාජ අඩවියේ වගේ රක්වානේ පොතුපිටිය පැත්තෙන් උඩහට ඒ ඉඩම්වල වතුර උල්පත්

මතු වෙලා තිබෙනවා. අපිට ඒවා උපයෝගී කරගෙන ගොඩක් අය වතුර බෝතල් ව්‍යාපාර කරනවා. බොහොම සුළු මුදලක් යන්නේ. අපිට පුළුවන් නම් මේ පළාත් සභාව හරහා අපිට ඒ කර්මාන්ත අධිකාරියට බලය තිබෙනවා හැකියාව තිබෙනවා මේ ව්‍යාපාර පටන් ගන්න. කරන්න සේවයක් හැටියට. අර වතුර රුපියල් සීයට තියෙන වතුර ලීටරය අපිට දෙන්න පුළුවන් නම් රුපියල් හතළිහට,පනහට,හැටට. අපිට ඉතාම ගුණාත්මක ශ්‍රීලංකා එස්එල්එස් සහතිකය හිමි යම් ව්‍යාපාරයක් හැටියට මේක පටන ගන්න පුළුවන් නම් ඒක නිසා අපි බලන්න ඕනේ මේ සම්බන්ධව හොඳ යෝජනාවක් ආවහම මේක ක්‍රියාත්මක කරන්නේ කොහොමද මේක ක්‍රියාත්මක කරන්න තියෙන අඩුපාඩුවක් තියෙනවා නම් ඒක මොකක්ද කියලා අපි මේක ක්‍රියාත්මක කරන්න ගියහම අපි වතුර ටික එකතු කරලා ලංකාවේ මිනිස්සුන්ට බොන්න දෙන්නේ නැතුව ඇමරිකන් කාරයාට බොන්න දෙන්න වගේ කතා කරනවා නම් ඒක හරි වැරදියි. ඒක තමයි අර කිව්වා වගේ යම්කිසි හිතේ එකක් තියාගෙන කතා කරනවා වගේ අදහසක් අපිට පේන්නේ. ඒක ඉතාම අගය කරන්නේ නෑ. සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමාගේ යෝජනාව අගය කරමින් එම ව්‍යාපාරය පටන් ගන්න හැකියාව තිබෙනවා නම් පෞද්ගලික අංශයත් එක්ක අපි බලන්න ඕනේ උරින් උර ගැටිලා බලන්න ඕනේ අපි කොහොමද දියුණු කර ගන්නේ කියලා. එහෙම අවස්ථාවක් ලැබෙනවා නම් ඒක කාලෝචිතයි කියන එක මේ අවස්ථාවේදී ඉතා පැහැදිලිවම කියන්නට ඕනේ. ඒක නිසා එතුමාගේ යෝජනාව අනුමත කරමින් ස්ථිර කරමින් මෙවැනි වැදගත් යෝජනාවක් ගෙන ඒම සම්බන්ධව එතුමාට ස්තූතිවන්ත වෙමින් මගේ වචන කීපය හමාර කරනවා. බොහොම ස්තූතියි.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக* *Hon.D.Chairman*
*Udayakantha Gunathilaka* ---------------------------------

බොහොම ස්තූතියි ගරු අජිත් කුමාර මැද්දෙගම මන්ත්‍රීතුමාට. මීළඟට අතුල කුමාර රාහුබද්ධ ගරු අමාත්‍යතුමාට අවස්ථාව ලබා දෙනවා.

*ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ* *கௌரவ*
*அமைச்சர் அதுல குமார ராஹூபத்த* *Hon. Minister*
*Athula Kumara Rahubadda*
-------------------------------------------------------

ගරු සභාපතිතුමනි අපේ සිරිපාල කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමා ඉතාම කාලෝචිත යෝජනාවක් තමයි ගෙනාවේ. මොකද මේ කාල වකවානුව තුළ අජිත් කුමාර ගරු මන්ත්‍රීතුමා ,රම්‍යකුමාර ගරු මන්ත්‍රීතුමා, ඒවගේම අජිත් ශාමින්ද ගරු මන්ත්‍රීතුමන්ලාගේ කතා ඇතුලේ තිබුණේ විශේෂයෙන්ම මේ අවශ්‍යතාවය කොච්චර දුරට ඕනේද කියන කාරණාව. ඒවගේම දේශපාලන කාරණාව. මේ සියල්ල ගත්තහම ස්වභාව ධර්මය ශ්‍රී ලංකාවාසී අපිට උරුම වෙලා තිබිච්චි දෙකක් තිබුණා ස්වභාවධර්මයෙන්ම නිකන් හම්බ වෙච්චි හුළඟයි. ජලයයි. අද හුළඟත් බොහොම අමාරුවෙන් තව අවුරුදු දහයක් පහළොවක් යන කොට මේකටත් මුදලක් වියදම් කරන්න වෙනවා අපිට හොඳ හුස්ම ටිකක් ගන්න. එතකොට මේකේ තිබිච්චි ප්‍රෞඪ ඉතිහාසයට හිමිකම් කියපු ඒ නිසා දැනටත් ලෝකයේ පවත්වමින් යනවා. මම කියන්නේ හෙට දවස තුළ සිදු වෙන දේවල් මම මේ වෙච්චි දේ ජලය කියන්නේ අපි කුඩා කාලයේ හැම තැනකම මේ ගමේ ගොඩේ තිබිච්චි දේවල් අද වෙන කොට සිරිපාල කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමා ගේන යෝජනාව ඇහැලියගොඩ ඉඳලා ඊට කිලෝමීටර් දෙක හමාරක් එහා පැත්තේ ඉඳලා ආපහු තියෙනවා එතෙන්ට බොන්න පානීය

ජලය නෑ. ඒ නිසා මේක දේශපාලන වැරැද්දක්. මේක අහවල් පක්ෂයේ වැරැද්දක්. අහවලාගේ වැරැද්දක් නෙමෙයි. සිරිපාල මන්ත්‍රීතුමා බොහොම සත්භාවයෙන් ගෙනාවේ. මේ යෝජනාව එතුමා ගෙනාවේ බොහොම සත්භාවයෙන්. හැබැයි මම දකිනවා ඊට එහා ගිය අපි අපිම දොස් කියා ගන්නවාට වඩා කලියෙන් මේ රටේ සියළුම නිදහස්වීමෙන් පස්සේ අපේ රටේ එතෙක් පැවති සියළුම රජයවල් මේකට වගකියන්නම ඕනේ. මේ සියල්ල සිද්ධ වුනේ වැරැද්දෙන්. ඒ වැරැද්දට උදාහරණයක් ඊයේ සිද්ධ වුණා. මම ඒකට උදාහරණය පස්සේ දෙන්නම්. මම එහෙම කිව්වේ සුද්දා අපිට කලියෙන් මේ රට පාලනය කළා. ඒ පාලනය කරන්න ආපු කාලයේ තේ වවන්න,කෝපි වවන්න ආපු කාලයේ සුද්දා දැක්ක මේ ජලය කියන එක මොන තරම් දුරට අපිට රටට ඒ මිනිස්සුන්ටත් ඕනේද කියන එක ඒ කාරණාව දැකලා අපේ රටේ තිබ්බ්චි හැම ජල මූලාශ්‍රයක්ම කෝපි වවන කොට තේ වවන කොට ආරක්ෂා කළා. රබර් වවන කොටත් ඒක ආරක්ෂා කළා. හැබැයි එතනින් පස්සේ වැව්ල්ලට ගිය අපේ ආණ්ඩුත් එක්ක අපි වගකියන්න ඕනේ අපි හැමෝම මොකක්ද කලේ . හැම ආණ්ඩුවක්ම මොකක්ද කලේ. මේක දිහා බලාගෙන හිටියා ඇහැක් ඇරියේ නෑ. තත්ත්වය එන්න එන්නම දරුණු වෙද්දී අද අපි තවත් කතා කරනවා ජලය ඊක ගන්න ජලය විදේශගත කරන්න. ඒවගේම හෙට දවස තුළ අපේ පැත්ත මම කතා කරන්නේ පැල්මඩුල්ල. දිය ඇලි 37 ක් තිබුණ සුන්දර ප්‍රදේශයක් පැල්මඩුල්ල ආසනය. ජලය කියන

ඒවාට අපි හැමෝම උදව් දුන්නා. සමහරවිට දේශපාලන බලය පාවිච්චි කරලා. එක්කෙනෙක්ගෙන් වෙච්චි වැරැද්දක් අහවලාගෙන් මෙයාගෙන් නෙමෙයි. මේ හැමෝගෙන්ම වෙච්චි වැරැද්දක්. ඉතිහාසයේ ඉඳලා ඒ සිද්ධි වෙච්චි වැරැද්දට දඬුවම් විඳින්න වෙන්නේ අපිට නෙමෙයි ඊළඟ පරම්පරාවට. ඒ නිසා මම ඊයේ දැක්කා මේ සම්බන්ධව කතා කරන්න මට වුවමනාවක් තිබුණා නමුත් ජාතික ප්‍රතිපත්තිය හදන තැනකදී කතා කරන්න දෙන්නේ නෑ. ජාතික ප්‍රතිපත්තිය හදපු තැන ඊයේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී මේ යෝජනාව ආවා. මොකක්ද ගත්තු තීරණය. මොකක්ද ගත්තු තින්දුව. මොකුත් නෑ. උඩින් පල්ලෙන් ගහලා නිකන් හිටියා. හැබැයි ඒක වෙනුවට ගත්තු තීන්දු මොනවාද. සාම්ප්‍රදායික පතල් කර්මාන්තයට ආපහු උදැල්ල දානවා. දාපු උදළු ටික ඇති අපි දාපු උදළු දෙක තුනම එකතු වෙලා. ඒ නිසා උදැල්ල දානවා කමක් නෑ. දාන්නේ ප්ලේට් එක. ඒ නිසා ප්‍රතිපත්තියක් අවශ්‍යයි. දැන් මේක ගහන්න කතා කරන එකිනෙකා විවේචනය කර ගන්න එක නෙමෙයි මෙතනට අවශ්‍ය වෙලා තියෙන්නේ. මට එදා 1991 දී. ප්‍රාදේශීය සභාවේදී පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට ඇවිල්ලා රිසව් එකක් කරපු විදේශීය කණ්ඩායමක් එදා ඇවිල්ලා සුන්දර කිරිදිඇල්ල බලන්න. ඒ බලන්න ආපු වෙලාවේ සභාව අපි ඇතුලේ හිටියේ. එල්.පී.ජයන්ත කියන ගරු සභාපතිවරයාගේ සභාවේ. අපි ඇතුලේ ඉන්න කොට ඒ කණ්ඩායම ඇවිල්ලා ඉල්ලීමක් කලා අපිට ඒ සුන්දර පරිසරය බලන්න ඒ ඇල්ල බලන්න අවස්ථාවක් දෙන්න කියලා. අපි ඒ හිටිය කාර්මික නිළධාරී කීප දෙනෙක් එක්ක

එක පාර හැම තැනම තිබුණා. හැබැයි අද නගරයට දවස් හතක් පැච්චොත් ජලය බොන්න නෑ. සුන්දර කිරිදිඇල්ල දිහම ලංකාවේ දිය ඇල්ල. තේ නිසා ජල මූලාශ්‍ර සියල්ලම මනුස්ස වර්ගයා විනාශ කළා. පෙරලා දඬුවම් දුන්නා. දවස් හතක් යන කොට සමස්තයක් යන කොට මෙහෙම වුණා. අද ඒ වැඩ පිළිවෙල කෝ. අද ඒ ජල මූලාශ්‍ර ආරක්ෂා කරන්න ගත්තු වැඩ පිළිවෙල කෝ. ක්‍රියාදාමය කෝ. ඒවගේම මේ රක්ෂිත කපන කොට

ඔවුන් ඇරියා. පැය භාගයක් විනාඩි 45 ක් විතර ගත කරලා ආවා. සභාවට ඇවිල්ලා සභාව ඉවර වෙන්න ඔන්න මෙන්න කියලා තිබුණේ සභාව ඉවර වෙනවාත් එක්කම ඔවුන් අපිත් එක්ක සාකච්ඡා කළා. සාකච්ඡා කරලා කිව්වා උඹලා හරි වාසනාවන්තයි. 1991 අපිට කියපු කතාව. විදේශිකයෙක් ඒක බලලා. උඹලා හරි වාසනාවන්තයි. උඹලාගේ ආසනය ගත්තහම හතර වටේම වතුර පාරවල්. යන එන හැම

තැනම පාලම් බෝක්කු මේ වතුර පිරිලා තියෙන්නේ. ඇල්ලට ගියහම සුන්දර ඇල්ලකුත් තියෙනවා. ඒක විතරයි අපි දැක්කේ. ළඟම ඇල්ල බලලා. . හැබැයි අවුරුදු පහක යන කොට මේ ඇල්ල දකින්න හම්බ වෙන්නේ නැහැ කියපුවහම මට හිනා ගියා. ඒ වගේ තිබ්ච්චි සුන්දර ඇල්ලක් අවුරුදු පහක් යන කොට හිදෙනවා කියන කොට හිනා යන්නේ නැද්ද. ඒ විදේශිකයා මා ගාවට ඇවිල්ලා මගේ දින පොත පෙරලලා ඔහු ලියලා ගියා ඔහුගේ අත් අකුරෙන් මේක වෙයිද නැද්ද කියලා බලා ගන්න කියලා. අවුරුදු පහක් ගියේ නෑ හතරයි. මොකක්ද වුනේ ඔහු ප්‍රකාශ කරපු දේ. ඔහු මැනලා තිබුණා රක්ෂිතයට ගිහිල්ලා දැව කපලා තිබුණ ප්‍රමාණය. කපලා තිබුණ ප්‍රමාණයයි විනාශ කරලා තිබුණ ප්‍රමාණයයි එකතු කරලා ගණන් හදලා බැලුවහම ඔහු කිව්වා මේක මේ කාල සීමාව වෙන කොට මේක දෙගුණ තෙගුණ වෙලා මේක විනාශ වෙන කාලය. හරියටම ඒ දේ සිද්ධ වෙනවා. ඒක ඒ කාලය තුළ සිද්ධ වෙන කොට අපේ පැල්මඩුල්ල නගරයට බොන්න වතුර නෑ. අපි මේ පළාත ගත්තොත් ඕන තරම් බලංගොඩ දවස් දෙක තුළ යන කොට මේ පහුගිය අවුරුදු එක හමාරම වැස්ස නෑ. ඒ නිසා සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව අපි අර අජිත් මන්ත්‍රීතුමා කිව්වා වගේ විදේශ රටකට ගිහිල්ලා වතුර බෝතලය ගන්නේ අපි මෙහේ රුපියල් හැටට ගන්න එක ඒ ඩොලර් දෙකට , ඩොලර් තුනට තමයි වතුර බෝතලය ගන්නේ. ඒ නිසා ආදායමක් එනවා. ආදායමට ඉස්සෙල්ලා අපි අපේ සම්පත රැක ගන්න නම් මොකද ජාතික ප්‍රතිපත්තිය හදන තැන ඊයේ සිද්ධියේදී රක්ෂිත ඇතුලේ බලාගාරයක්

කරන්න කියලා. ඒ නිසා මේක කොච්චර කතා කළත් කොච්චර කාලයකට මේ විවේචනය සීමා වෙනවාද කියන කාරණාව අපිට තේරෙන්නේ නෑ. ඒ නිසා මම යෝජනාවක් ගේන්නේ ගරු මන්ත්‍රීතුමා කාලෝචිත යෝජනාවක් කියලා කිව්වේ ඒකයි. හොඳ යෝජනාවක් නිසා අපි පළාත තුළ මේ ප්‍රතිපත්තිය ජාතික ප්‍රතිපත්තියක් විදිහට හදලා දීපු මම යෝජනාවක් කරනවා ඒ ප්‍රතිපත්තිය කවුරු පාලනය කළත් මේ පළාත් සභාවේ මොන පක්ෂ පාලනයේ හිටියත් ඒ ජාතික ප්‍රතිපත්තිය නොකැඩුවොත් අපිට ඉතුරු වෙලා තියෙන ජල මූලාශ්‍ර ටිකයි මේ ජල සම්පතයි ආරක්ෂා කර ගන්න පුළුවන් නම් එහෙම නොවුණොත් අපි මෙතන කතා කරලා එක තීන්දුවක් ගන්නවා ජාතික ප්‍රතිපත්තිය හදන තැන තව තීන්දුවක් ගන්නවා ඒ දෙක ගැලපෙන්නේ නැතුව මේ දෙක දෙපැත්තට විනාශ වෙලා යනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි මම ඇත්තටම ඊයේ කතා කරන්න බලාපොරොත්තු වෙලා හිටියේ ජාතික ප්‍රතිපත්ති හදන තැන මහා ලොකු ලොක්කන්ට මේක කියලා දෙන්න. නමුත් අවාසනාවකට ඒක එච්චර ගණන් ගත්තේ නෑ. අපි දෙන්නා පිටුපස්සට වෙලා කතා කර කර හිටියේ. අපිට කතා කරන්න අවශ්‍යතාවයකුත් තිබුණත් ඒකට අවශ්‍ය වෙලාව හම්බ වුනේ නැති හින්දා අද කතා කලේ. කතා කරලා ක්‍රියාවට නන්වන්න බැරි නම් අපි මේක දේශපාලන කෝණයකින් බලලා මොන පැත්තෙන් ද කොයි පැත්තද හෙට කාටද විවේචනය කරන්නේ කවුරුද ඒකේ වගකියන්න ඕන කාරණාව නෙමෙයි. පළාත් සභාවක් විදිහට මේකට පළාත් ප්‍රතිපත්තියක් හදමු ජල මූලාශ්‍ර ටික එදා අපේ රටට ආපු සුද්දා එදා අපේ රටේ තිබ්ච්චි ජල

ගහන්න තීන්දු කරනවා නම් ඊළඟට ලෝක උරුමය ඇතුලේ පාරවල් හදන්න කතා කරනවා නම් ඒවගේම ආපහු ගිලා බැහැලා තියෙන පතල් ටික අතුලේ ආපහු උදැල්ල දාන්න දෙනවා නම් මේ කතා කරන සියළු දේ ජාතික ප්‍රතිපත්තිය කැළේ ගියත් පළාත් සභාව ඇතුළේ අපිට කතා කරන්න තියෙන්නේ තියෙන ජල මූලාශ්‍ර ටික සකස්

මූලාශ්‍ර ටික ආරක්ෂා කළා නම් ආදරය කළා නම් පළාතේ ජීවත් වෙච්චි මිනිස්සු හැටියට අපේ තියෙන ජල මූලාශ්‍ර ටික ආරක්ෂා කර ගන්න අවශ්‍ය කරන ප්‍රතිපත්තිය ප්‍රඥප්තියක් හරහා ඒ වැඩ පිළිවෙල මේ සභාවේ ඉතාම කඩිනමින් මේ දින කීපය මේ සභා කාලය ඉවර වෙන්න ඉස්සර වෙලා අවශ්‍ය කටයුතු

කරන්න අවශ්‍ය පූර්ණ සහයෝගය යොදනවා. එදාට අපෙන් පස්සේ පළාත් සභාවල අපි නොහිටියත් මේ ගෙනාපු යෝජනාවේ සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා නොහිටියත් මේ පළාතට ආදායමක් සහ මේ කතා කරපු වතුර ප්‍රශ්නයට ඒ අවශ්‍ය ඉඩකඩක් සැලසෙනවා. ඒ නිසා ඔබතුමාට බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා කාල වේලාව ලබාදීම පිළිබඳව.

*ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක*

*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.Chairman Udayakantha Gunathilaka* ---------------------------------
---------------------------------------------------

බොහොමත් ස්තූතියි අතුල කුමාර රාහුබද්ධ අමාත්‍යතුමනි.

අංක 15.2 යටතේ ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා යෝජනා අංක 6/1/2017/10 වෙනි දින ඉදිරිපත් කරන ලද යෝජනාව සඳහා විවාද කිරීම පිළිබඳව සියළු දෙනාටම මම ස්තූතිවන්ත වෙනවා. මීළඟට මෙම යෝජනාව සභා සම්මත කිරීමේ අවස්ථාව. සියළු දෙනාගේ එකඟතාවය ලැබෙනවා. ඒ අනුව ඒකමතිකව සභා සම්මත වූ යෝජනාවක් හැටියට සලකනවා.

අංක 15.3 යටතේ ගරු මන්ත්‍රී කරුණාපාල මැතිතුමාගේ යෝජනාව යෝජනා අංක 6/1/2017/11 දින දරණ යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

*ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල* *கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால* *Hon.Member G.M.Karunapala* ---------------
-------------------------

ගරු සභාපතිතුමනි ප්‍රථමයෙන්ම තුල්හිරිය ප්‍රශ්නයටත් සිරිපාල කිරිඇල්ල මැතිතුමාගේ වැදගත් යෝජනාවට වචනයකින් හරි සහයෝගය ලබාදීමට නොහැකිවීම පිළිබඳව කණගාටු වෙනවා. දෙකම ක්‍රියාත්මක විය යුතු යෝජනා. ඒ සමගම මේකත් ඉතා වැදගත්. සමස්ත ප්‍රාදේශීය සභා හා පළාත් පාලන ආයතන 13 වෙනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මත පළාත් සභාවට බලය පැවරුණු ඒකකයක්. ඒඅනුව ඇතැම් පළාත් පාලන ආයතන පෞද්ගලිකව තම තමන්ගේ වුවමනා එපාකම් මත පොදු දේපළ තාවකාලිකව පෞද්ගලික අංශයට ලබාදීමට කටයුතු කරනවා. මේක ලොකුම පළාත් සභාවට කරනු ලබන නිග්‍රහයක්. පැවරුණු බලයට කරන අපරාධයක්. මම දකින්නේ. ඒ නිසා මම යෝජනා කරන්නේ සබරගමුව පළාත් සභාවට අයත් විශේෂයෙන්ම පළාත් පාලන ආයතන සතු ගොඩනැගිලි නේවාසිකාගාරවලට බදු දීමටත් කුළී පදනම මත දීමටත් සබරගමුව පළාත් සභාව ක්‍රියා කරන බව දැන ගැනීමට ලැබී ඇත. මෙය තාවකාලික කටයුත්තක් සඳහා යෝජනාව තමයි සම්මතය අරන් තියෙන්නේ. මේක සම්පූර්ණයෙන් නැවැත්විය යුතුයි කියන යෝජනාවේ මම ගේන්නේ.

ගොඩාක් මෙතන ඉන්නේ. මම වටෙන් ගහන්නේ. ඒ හින්දා ඇහුන්කන් දෙන්න මට. මෙතන ගොඩාක් ඉන්නේ පළාත් පාලන ආයතන නියෝජනය කරපු මන්ත්‍රීවරු, උපසභාපතිවරු, සභාපතිවරු තමයි පළාත් සභාවට ආවේ. ඒ අය තමන්ගේ බලය ලත් කාල සීමාව තුළ තමාගේ ආයතන ගොඩක් දියුණු කළා. ඔබතුමා මට කෙලින්ම කිව්වා. මම කොහොමත් කියනවා. ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව තාමත් ආදායම් ඉපයීමේ

ක්‍රමවේදයක් හැදුවේ කරුණාපාල. හිටපු සභාපති. මම නව වෙළඳ සංකීර්ණයත් සභා ගර්භයත් හදලා කුළී පදනම මත දෙන දිගු කාලීන ස්ථාවර ගොඩනැගිලි ගණනාවක් හදලා ආදායම් තත්ත්වය පළාත් සභාව ප්‍රතිපාදන

නොදුන්නත් ක්‍රියාත්මක කරන තත්ත්වයට මම පත් කළා. එහෙම ඉන්න කොට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවෙන් අපිත් සභාපතිවරයා වශයෙන් අපේ රත්නායක සහ පරණ සභාපතිවරයා වශයෙන් සිටින කාලය තුළ ඒක තමයි ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා කාලය. ඊට පස්සේ මගේ කාලය තුළ මම මේක නගරයකට ගෙනල්ලා ඒක අපේ භාණ්ඩ සුරක්ෂිත ආයතනය බවට පත් කළා. දැනට විධිවිධාන යොදාගෙන යනවා කියලා ආරංචියක් තිබෙනවා. මෙන්න මේ පරණ සභා කාර්යාලය අයෙකුට තාවකාලිකව කොහොම හරි පදිංචියට දෙන සූදානමක් ඒ ගැන දැඩි විරෝධයක් තියෙනවා අපේ ප්‍රදේශය තුළ. ඒ විරෝධත්වය දැනට මේ ආණ්ඩුව ඡන්ද නොතියන නිසා පළාත් පාලන ඡන්දය . ඒ කියන්නේ පළාත් පාලන ආයතන දැනට නිළධාරී මට්ටමේ ක්‍රියාත්මක වෙනවා. ඒකත් චෝදනාක් කරන්න එපේ. ඒ නිසා අජිත් කුමාර මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට ගැලපෙන්නේ නෑ. ඡන්දය තියන්නේ නෑ බයයි. පළාත් පාලන ඡන්දය සීමා නීර්ණය කරනවා කියලා මොනවා හරි කියලා දිගින් දිගටම කල් දාන්න මේ තියෙන බය නිසාමයි. එක්සත් ජාතික පක්ෂය හා හවුල් ආණ්ඩුව බයයි අපි ඒකාබද්ධ විපක්ෂය කිසිසේත් බය නෑ ඡන්දයකට හෙට පළාත් පාලන ඡන්දය තිබ්බත් අපි දිනනවා. පරාද වෙන කොටසකුත් ඉන්නවා. ඒ නිසා තමුන්නාන්සේලාත් බල කරන්න අපි වගේ. මෙතන බොරුවට කෑගහන්නේ නැතුව සිංහයා වගේ බලපෑම කරන්න තමුන්නාන්සේලාගේ නායකත්වය මට්ටමට තියෙනවා ඡන්ද ටික දිනන පරාද වෙන එක වෙන දෙයක්. බල කරන්න. අපි විධායක සභාවේදී ජනාධිතිපතිතුමාගෙන් ප්‍රශ්න අහන්නේ හැමදාම ඇයි ඡන්ද තියන්නේ නැත්තේ කියලා. ව්‍යාවස්ථා සම්පාදන පුස්තකාලය යනු ඉෆ්ලාර්ගේ. මම එහෙම කියන්නේ හැබැයි අපි දන්න නීතියකුත් නෑ

සීයෙන් එකක්වත් කියවලා නෑ. ඒ නිසා ඔහොම හැසිරෙන්නේත් නෑ. කවුරු කතා කළත් අපි කාටවත් බාධා කරනවාද. අපි ඉඳගෙන උත්තර දෙනවාද. දැන් මේ උදවියට ගරු මන්ත්‍රීතුමන්ලාට අර සම්පාදනුකූලව නිළ ඇඳුම ඇඳගෙන ඉන්න එක විතරයි කරන්නේ. අනිත් මොකවත් නෑ කාටවත් බාධා කරන්න එපා. නැණ උගත් මන්ත්‍රීවරු එළපුරුදු මන්ත්‍රීවරු. ඉඳගෙන කතා කරන්න එපා. දැනට කරන්නේ යුනිෆෝම් එක ගහන එක විතරයි. මොකක්ද මේකේ තේරුම. තමුන්නාන්සේලා හැමදාම කියන මේ පළාත් සභාව සැහැල්ලු කරනවා කියන එක තමුන්නාන්සේලානේ කියන්නේ. ඒක හින්දා ඡන්දය තියන්නේ නෑ මේ ආණ්ඩුව. ඒක බයයි එක්සත් ජාතික පක්ෂය. ඒකට බයයි මෛත්‍රීපාල සිරිසේන මහත්තයාගේ නඩය. තමුන්නාන්සේලාත් මෙතන කෑගහන්නේ නැතුව නායකතුමාට කියන්න ඡන්දය තියන්න. අපි නගර සභාව දිනනවා කියලා අපි කියන්නේ තියන්නේ නැත්තේ බයට තිබ්බොත් අපි දිනනවා. එහෙම නම් මේකටත් අද ප්‍රශ්නයක් වෙලා තියනවා. අද ප්‍රාදේශීය සභාව සිහින දැක්කා පහුගිය අවුරුදු කීපයේ කිරි බත් උයපු නැති ගෙවල් කීයක් තියෙනවාද. පොල් ගෙඩියක් කීයද. මේ ළඟදී කඩේකින් ඉදිආප්ප ගත්තා සම්බෝල කෝ. අයියෝ පොල් ගෙඩියක් ඇහැට දැකපු කාලයක් නෑ කිව්වා. බොරු ඔයාලා බොරු අපි ඇත්ත. මේ ඇත්ත කතාව. මේ ගම් මට්ටමේ බැහැලා ඉන්න. අවුරුද්දට කඩ කාරයෝ ඔක්කෝම බංකොලොත්. වාහන ගන්න නිසා ඉෆ්ලාර් මන්ත්‍රීතුමාට ප්‍රශ්නයක් නෑ. මමත් ණයට අරන් යන එක වෙනම දෙයක්.

රීතියකුත් නෑ. ව්‍යවස්ථාවකුත් නෑ. බොරු නෙමෙයි. තමුන්නාන්සේලාගේ වචන කීපයක් තියෙනවා එය හසුරුවමින් පුස්තකාලය වෙන්න හැදුවාට වැඩක් නෑ අපි මේ කියවන ඒවෙන්

*ගරු මන්ත්‍රී කේ.එල්.රත්නායක* *கௌரவ*
*உறுப்பினர் கே.எல்.ரத்நாயக* *Hon.Member*

*K.L.Ratnayake* ----------------
---------------------------------

ගරු මන්ත්‍රීතුමා බාධා කරනවා නෙමෙයි සභාවේ ගණපූරණය නෑ.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.Chairman Udayakantha Gunathilaka* ---------------------------------
---------------------------------------------------

මට ප්‍රශ්නයක් නෑ රීතිය අනුව ඉදිරිපත් කරන්න. ඔබතුමා ගණපූරණය නෑ නම් රීතිය අනුව ඉදිරිපත් කරන්න. මම අවශ්‍ය කටයුතු කරන්නම්.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල*** *கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால Hon.Member G.M.Karunapala* ---------------
-------------------------

රීතිය දන්නේ නෑ මගේ රත්නායක මිත්‍රයා. යෝජනා වෙලා සම්මත වෙන්නට ඕනේ. එතකොටයි සභාපතිතුමාට බලය තියෙන්නේ ගණපූරණයක් නෑ සභාව කල් දාන්න කියලා එහෙම නැතුව කියලා වැඩක් නෑ. ඒක හින්දා ඒක වෙනම දෙයක්. මගේ යෝජනාව දිගටම කරන්නේ මේ පළාත් පාලන ආයතන වලට අයිතිව තිබුණ කිසිම ගොඩනැගිල්ලක් අයතා විදිහට කුළී පදනම මත නොදෙන්නට කියලා මම යෝජනාවක් ගේනවා.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.Chairman Udayakantha Gunathilaka* ---------------------------------
---------------------------------------------------

බොහොම ස්තූතියි කරුණාපාල මන්ත්‍රීතුමාට. මීළඟට නමින්ද අනුරප්‍රිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

***ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය*** *கௌரவ நமிந்த அனுரபிரிய Hon.Member Naminda Anurapriya*
-----------------------------------------------------------

අපේ කරුණාපාල මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මම කතා කරන්න බලාපොරොත්තු වෙලා හිටියේ ගරු සභාපතිතුමනි අපේ පළාත් පාලන ආයතන යටතේ තිබෙන යම් ස්ථානයක් තිබෙනවා නම් ඒක පෞද්ගලිකව කාගේවත් භුක්ති විඳිහට ගන්න එක වැරැද්දක්. ඒ නිසා මෙතුමා යෝජනා කරපු ස්ථානය මම දන්න විදිහට ඉතාමත් හොඳ තැනක්. අපි යෝජනා කර සිටිනවා ගරු සභාපතිතුමනි සාමාන්‍යයෙන් නිවාඩු නිකේතනයක්. හෝටලයක්.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්*** *கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார் Hon.Member M.Y.M.Iflar* -----------
------------------------------

ගරු සභාපතිතුමනි එක පනතේ 10.4 වගන්තිය යටතේ නියමිත පරිදි සභාවේ ගණපූරණය මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතුයි. සභාවේ ගණපූරණය නොමැති බව සභාපතිවරයාට පෙනීයන හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් මන්ත්‍රීවරයෙකු විසින් සභාපතිවරයාගේ අවධානය යොමු කරන ලද

හෝ සෑම විටක කැඳවීමේ සීනුව නාද කිරීම නියෝග කල යුතුය. විනාඩි පහක් තුළ ඇවෑමෙන් ගණපූරණය ඇති නොවේ නම් පනතේ 10.5 වගන්තිය අනුව සභාව කල් තැබීම හෝ ගණපූරණය ඇති වනතුරු රැස්වීම අත් හිටුවීම සභාපතිවරයා ක්‍රියා කළ යුතුයි. ගණපූරණය ගණනය කිරීමේදී සභාපතිවරයා ඊට ඇතුළත් විය යුතුය. ගරු සභාපතිතුමනි 15 දෙනෙක් සිටිය යුතුයි. ඔබතුමා සමඟ.

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.Chairman Udayakantha Gunathilaka*
----------------------------------------------------------------------------------------

මෙම ගරු සභාව විනාඩි දහයකට කල් තියනවා.

**ගරු සභාපතිතුමා මූලාසනය ගනී.**

***ගරු නි.සභාපති උදයකාන්ත ගුණතිලක***
*கௌரவ பி.தவிசாளர் உதயகாந்த குணதிலக Hon.D.Chairman Udayakantha Gunathilaka*
----------------------------------------------------------------------------------------

මෙම ගරු සභාවේ ගණපූරණය නොමැති නිසා 2017.05.16 වෙනි දින පෙරවරු 10.00 දක්වා සභාව කල් තබනවා.

අත්/කළේ :
උදයකාන්ත ගුණතිලක
නියෝජ්‍ය සභාපති,
සබරගමුව පළාත් සභාව.

පී.එස්.ආර්.එම්.විජයරාජ,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2017 ක් වූ මැයි මස 09 වෙනි දින,
සභා ලේකම් කාර්යාලයේ දීය.

(අශෝධිත පිටපත)